2026.06.07 ඉරිදා | හත්වැනි කාණ්ඩය | 46 වැනි කලාපය
දැන් ඉරිදා

# මව්රට

රු.100

උපුල් ජෝෂප් ප්‍රනාන්දුගේ
**ගුරුදූ විග්‍රහය**



## ජවිපෙ ආණ්ඩුවෙන් ගැලවෙයිද?

P » 04





ජනාධිපතිවරණයට අවුරුදු 3ක් තියෙද්දී

# පොදු අපේක්ෂකයෝ රොත්තක්

P » 02

## තිස්සකුට්ටි පොහොට්ටුවෙන් දොට්ට?

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ජානක තිස්සකුට්ටි ආරච්චි මහතා වහාම පක්ෂයෙන් ඉවත් කරන ලෙසට එම පක්ෂය ඇතුළෙන්ම නාමල් රාජපක්ෂ මහතා වෙත විශාල ඉල්ලීම් ප්‍රමාණයක්...

P » 02



දිට්වා කුණාටුවට දුන්නු

## ආධාර සත පහක් වියදම් කරලා නෑ

දිට්වා සුළි කුණාටුවෙන් හානියට පත් ජනතාවට වන්දි ලබාදීමට හා විනාශ වී ගිය පොදු දේපළ යළි ගොඩනැගීමට ආරම්භ කරනු ලැබූ රී බිල්ඩින් ශ්‍රී ලංකා අරමුදලට එකතු වූ මුදල් කිසිවක් මේ වනතෙක් වියදම් කොට නොමැති බව මුදල් කමිටුවේදී අනාවරණ විය.

P » 02

## මෛත්‍රී පරද්දලා අනුර දිනලා

P » 02

## ගෝඨා-චමල් ඇතුළට බැසිල්ට රතු නිවේදන

P » 06

## රනිල් පාර්ලිමේන්තු එන්නේ නෑ

P » 02

අහුවෙන්න එපා

## රට පුරා මහා ගස්-පැළ වංචාවක්

P » 02

## නවීන් සජබ එක්ක ඉල්ලන්න තීන්දු කරයි

P » 02

## එජාප ප්‍රබලයන් පෝලිමේ සජිත් ළඟට

P » 07



## අයිසීසී එක ඉරාන්ට දොර වහයි

P » 07

## ආණ්ඩුව රිපෝට් එකක් එළියට දමයි

P » 07

## ගෝර් අනුරව මගහැරියේ ඇයි?

P » 06

## කුඩු ෂෝ එක කුඩෙ කුඩු

P » 08





ඔබේ බිස්නස් එකට Power එකක් දෙන්න ළඟම තියෙන Dialog එකට එන්න
කුඩා හෝ මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙනුවෙන්ම සකස් වූ තාක්ෂණික විසඳුම්

Business Connectivity පහසුකම්
Business Wi-Fi පැකේජ
Business DTV සබඳතා
Smart Tracking සේවාවන්

ඔබගේ ළඟම ඇති Dialog ශාඛාවේ අපගේ නියෝජිත මහතා (Enterprise Advisor) හමුවී
ඔබේ ව්‍යාපාරයට ගැලපෙනම ඩිජිටල් විසඳුම් ඇතුළු අනෙකුත් සේවාවන් ගැන දැන ගන්න.

0777 887 887 | business.dialog.lk

Dialog ENTERPRISE



‘අම්මා දන්සලට ගියා
ඊට පස්සේ කැබ් එකක්
ඇවිල්ලා අම්මාව
හප්පගෙන ගියා’
ඒ දරුවාට තවමත්
මරණය යනු කුමක්දැයි
නොතේරෙන්නට
ඇති.

# මරුවා පරාජය කරපු වෙසක් දවසේ ජයගත් මීගොඩ මරුවා

**වෙසක් යනු බුදුරජාණන් වහන්සේගේ තෙමඟුල සිහිපත් කෙරෙන උතුම් දිනයයි. පහන් එළි දල්වා අඳුර පලවා හරින අතරම මිනිසුන්ගේ හදවත ප්‍රඥාවෙන් ආලෝකවත් වන කාලයක්. මේ නිසාම වෙසක් සමය ඇරැඹෙන්නේම හැම කෙනාගෙම හිත් පහන් කරවන සුන්දර හැඟීමකින්. එහෙත් මේ උතුම් වෙසක් දිනයේ මීගොඩ ප්‍රදේශයෙන් අහන්නට ලැබුණේ රටම කම්පා කරවන පුවතක්.**

වෙසක් සතුට නිමේෂයකින් නිමා කරමින් අපරීක්ෂාකාරී රියැදුරෙක් නිසා වටිනා ජීවිත 06ක් විනාශ වුණා. මෙය සාමාන්‍ය රිය අනතුරක් නම් නොවේ. පවුල් කිහිපයකම හෙට දවස උදුරාගත්, තරුණයන් කිහිපදෙනකුටම මවුපියන්ගේ හදවත් හිස් කළ වෙසක් සතුට නිමේෂයකින් අවසන් කළ ඛේදවාචකයක් වුණා. එදා රාත්‍රියේ දන්සල අසල මිනිසුන්ගේ සිත් පිරී තිබුණේ පිනකින්. බොහෝ දෙනෙකු රොටියක් කන්න පෝලිමේ හිටියා. ඒ අහිංසක ආසාවක්. තවත් කෙනෙක් තම දරුවන් අතින් අල්ලාගෙන හිටියා. තවත් කෙනෙකු තමන්ගේ පවුලේ ආදරණීයයන් සමග සතුටෙන් කතාකරමින් පෝලිමේ සිටියා. ඒ කිසිවෙකුත් දැන සිටියේ නැහැ තමන්ගේ ජීවිතවල අවසන් මිනිත්තු කිහිපය මේ ගතකරමින් ඉන්නේ කියලා. නමුත් ඊළඟ නිමේෂයේ අසන්නට ලැබුණේ සිනහව නොවේ කෑගැසීමක්. හැමෝම තමන්ගේ ආදරණීයයන් හෙව්වා. එක මොහොතකින් දන්සලක් මරණ භූමියක් බවට පත්වුණා. මුළු රටම මේ ගැන කතාකරන්නට වුණා.

වෙසක් සමයේ අපට අසන්ට ලැබුණු කනගාටුදායකම පුවත වුණේ මීගොඩ දන්සලකට ගිය පිරිසකට සිදුවූ කනගාටුදායක සිදුවීමයි. මේ අනතුර සිදුව තිබුණේ පසුගිය මැයි 31 වැනි දින රාත්‍රි 11.50ට පමණයි. 119 දුරකතන අංකය යටතේ මීගොඩ පොලිසියට දුරකතන ඇමතුමක් ලැබීමෙන් අනතුරුව පොලිසිය ක්‍රියාත්මක වනවා. වෙසක් පොහොය නිමිත්තෙන් මීගොඩ මංසන්ධිය ආසන්නයේ රොටි දන්සලක් සංවිධාන කර තිබුණා. දන්සලට සහභාගි වීමට බොහෝ පිරිසක් පොහොය දවසේ රාත්‍රියේ පැමිණ තිබුණා. ක්ෂණයකින් සිදුවූයේ කිසිවෙක් නොසිතූ ඛේදවාචකයක්. අවිස්සාවේල්ල සිට කොළඹ දෙසට ධාවනය වූ කැබ් රථයක් දන්සල් පෝලිමේ සිටි පිරිසට අනතුරක් සිදුකර පලාගියේ සිදුවූයේ කුමක්ද යන්න කිසිවකුටත් සිතාගැනීමට හෝ ඉඩ නොදෙමින්. කැබ් රථය පලාගිය ආකාරය අසල වූ ආරක්ෂිත කැමරාවල සටහන්ව තිබුණා.

වඩාත්ම හදවත බිඳ දැමුවේ කුඩා දරුවකුගේ වචන කිහිපයක්. ‘අම්මා දන්සලට ගියා ඊට පස්සේ කැබ් එකක් ඇවිල්ලා අම්මාව හප්පගෙන ගියා’ ඒ දරුවාට තවමත් මරණය යනු කුමක්දැයි නොතේරෙන්නට ඇති. ඔහු තවමත් හිතනවා ඇති අම්මා ආයෙත් ගෙදර එයි කියා. ආයෙත් ඔහුව තුරුළු කරගනියි කියා. නමුත් ඔහු නොදන්නා සත්‍යය නම් අම්මා නැවත කිසිදා ගෙදර නොඑන බවයි. දන්සලට පැමිණි සිටි පිරිස ඒ මේ අත දිව්වේ කෑගසමින්.

අනතුරින් තුවාල ලැබූ 13 දෙනකු කඩිනමින් හෝමාගම මූලික රෝහලට ඇතුළත් කිරීමට පියවර ගනු ලැබුවත් අවාසනාවකට ඉන් 06 දෙනකු ජීවිතක්ෂයට පත්වුණා. ජීවිතක්ෂයට පත්වූවන් අතරින් දෙදෙනකු අඹුසැමියන් බව වාර්තා වුණා. පොලිසිය අනාවරණ කරනු ලැබුවේ මේ අඹුසැමි යුවල අවිස්සාවේල්ල ප්‍රදේශයේ පදිංචිව සිටි අතර, බිරිඳගේ මවුපියන් බැලීම සඳහා පිළියන්දල ප්‍රදේශයට ගොස් යළි නිවස බලා පැමිණෙමින් සිටියදී මෙම අනතුර සිදුව ඇති බවයි.

අනතුර සිදුවන අවස්ථාවේ ගොඩගම මංසන්ධියේ රාත්‍රී සේවයේ නිරතව සිටි පොලිස් නිලධාරීන් කැබ් රථයේ රියැදුරු අල්ලා ගැනීමට කටයුතු කරනු ලැබුවා. එම රියැදුරු ඒ අවස්ථාවේ බීමතින් සිටි බවද පොලිසිය සිදුළ පරීක්ෂණවලින් අනාවරණ වී තිබුණා. ඔහු පිළියන්දල ප්‍රදේශයේ පදිංචි 42 හැවිරිදි පුද්ගලයකු බවයි අනාවරණ වුණේ.

මියගිය පිරිස අතර පිරිමි පුද්ගලයන් තිදෙනකු, කාන්තාවන් දෙදෙනකු සහ 15 හැවිරිදි දැරියක් සිටින බවද සඳහන්ය. මෙම අවාසනාවන්ත සිදුවීමෙන් දිවි අහිමි වුණේ හංවැල්ල, අවිස්සාවේල්ල සහ පිළියන්දල යන ප්‍රදේශවල පදිංචිකරුවන්ටයි.

මේ ලෝකේ අම්මෙකුට තාත්තෙකුට දරාගත නොහැකිම වේදනාව වන්නේ තම දරුවාගේ මරණයයි. අවාසනාවකට එදා ඒ වේදනාව පවුල් කිහිපයකටම උරුම වුණා. මේ සියල්ල සිදුවුණේ බීමත් රියැදුරෙකුගේ නොසැලකිල්ලයි.



නිලන්ති රේණුකා

අනතුර සම්බන්ධයෙන් රථවාහන පාලන හා මාර්ග අංශ භාර නියෝජ්‍ය පොලිස්පති ඩබ්ලිව්.පී.ජේ. සේනාධීර මහතා මෙම අනතුර සම්බන්ධයෙන් පවසා සිටියේ මෙවැන්නකි.

‘හයිලක්ස් වර්ගයේ කැබ් රථය ලොරියක් පිටිපස්සෙන් ඇවිත් තියෙන්නේ. මේක දකුණු පැත්තෙන් ඕවර්ටේක් කරන්න හදලා ඉස්සරහින් එන ලොරියක් නිසා නැවතත් වම් පසින් ඕවර්ටේක් කරලා තියෙනවා. ඔහු දැන දැනම තමයි මේ අපරාධය කරලා තියෙන්නේ. ඔහුගේ ළඟ වලංගු රියැදුරු බලපත්‍රයක්වත් තිබුණේ නැහැ. ලිපි ලේඛනත් වලංගු ඒවා නෙවෙයි. වැලි තීරුවේ හිටපු අහිංසක මිනිස්සු මේ. ඔහුට විරුද්ධව අපරාධ නීතිය යටතේ පුළුවන් උපරිම දඬුවම ලබාදෙනවා. වාහනයේ අයිතිකාරයත් ඉඳලා තියෙනවා. පසුව ඒ පුද්ගලයා එතැනින් ඉවත් වෙලා තියෙනවා. බීමත්ව අහිංසක ජනතාවගේ ජීවිත විනාශයට පත්කරන අයට දැඩිව නීතිය ක්‍රියාත්මක කරනවා. අපි කියනවා මත්ද්‍රව්‍ය මත්පැන් භාවිත කරලා වාහන පදවන්න එපා කියලා. මත්පැන්වලට සම්පූර්ණ මනස විකෘති වෙනවා. මාර්ග අනතුරක් වුණාම දණ්ඩ නීති සංග්‍රහයේ 298 වගන්තිය යටතේ තමයි අපි කටයුතු කරන්නේ. නොසැලකිලිමත් ක්‍රියාවකින් මරණයට පත්කිරීම මේකෙන් ඔප්පු වුණා මත්පැන් භාවිත කරලා මනස විකෘති වෙලා කියලා. මේ අනතුර මුල් අවස්ථාවේ නවත්ත ගන්න තිබුණා ඇගේ වදිනකොටම....’

මෙම සැකකාර පුද්ගලයා හෝමාගම අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රක්ෂිත බන්ධනාගාර ගත කෙරුණා.

සමහරු බණින්නට පුළුවන් පාර අයිනේ දන්සලක් තිබ්බේ මොකටද කියලා. දන්සල නෙවෙයි ප්‍රශ්නේ. විනයක් සංවරකමක් නැතුව වාහන පදවනකොට මෙවැනි ප්‍රතිඵල තමයි උරුම වෙන්නේ. දන්සලක් එතැන තිබුණේ නැතත් පාර අයිනේ යන අහිංසක මිනිස්සු, අසරණ දරුවෝ, මවුපියෝ, අවට ප්‍රදේශවාසීන් කොයි තරම් මෙතැනින් ගමන් කරනවාද? එක අතකින් මත්පැන් පානය කරලා. තවත් අතකින් රියැදුරු බලපත්‍රයක් නැහැ. කොයි තරම් අහිංසක ජීවිතද මේ විනාශයට පත්වුණේ? වාහනයක් අතට ගන්න ඉස්සෙල්ලා දෙපාරක් හිතන්න. තමන්ගේ ජීවිතය විතරක් නෙවෙයි විනාශ වෙන්නේ අසරණ මිනිස්සුන්ගේ අහිංසක ජීවිත බව හිතට ගන්න. මේ පවුල්වල ආදරණීයයන්ගේ ජීවිත නැවත ලැබෙන්නේ නැහැ. මේ ජීවිත ගැන හිතුවා නම් අද මෙවැනි ඛේදවාචකයක් සිදුවෙන්නේ නැහැ.

මත්පැන් පානය කර වාහනයක් පැදවූ එක් පුද්ගලයකුගේ වගකීම් විරහිත ක්‍රියාවක් නිසා ජීවිත හයක් නිවීගියා. මියගියේ ජීවිත හයක් විතරක් නෙවෙයි. සිහින, බලාපොරොත්තු, පවුල්වල සතුට, දරුවන්ගේ අනාගතය මුළුමනින්ම බිඳවැටුණා. මේ පවුල්වලට ආයේ කවදාවත් වෙසක් කියන්නේ සතුටක් නෙවෙයි අමිහිරි මතකයක්. දන්සලක් දකින වාරයක් පාසා ඔවුන්ට මතක් වෙන්නේ ඒ වේදනාබර අවසන් රාත්‍රියයි. ජීවිතය කෙතරම් අස්ථිරද? මරණය කෙතරම් සමීපද? එක් තත්පරයකින් සියල්ල වෙනස් විය හැකි බව මේ ඛේදවාචකය අපට නැවත නැවතත් මතක්කර දුන්නා. ඒ අහිංසක ජීවිත මතු උපදින භවයක මෙවැනි අකල් මරණවලට ගොදුරු නොවේවා. ඔවුන්ගේ ආදරණීයයන්ගේ අහිමිවීම මේ පවුල්වලට දරාගැනීමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනය කරමු.

## හාන්දා ශ්‍රීගේ කැබිනෙට්ටුව

### පල්ලම් බස්සවයි අද රට හැටට හැටේ

ලැබගෙන ඇමැතිකම් පස් වසරකට රටේ
දෙන හැටි පෙනෙනවද රට දස අතට බැටේ
අපි උගතුන්ය කිය කිය ඉඳ කතිර කටේ
පල්ලම් බස්සවයි අද රට හැටට හැටේ

දිගුකොට ඇඟිල්ලක් හතරක් පසට නමා
නොපනත්කම් කෙරුමෙ වරදම උපතෙ තමා
වැඩ කොට තිත තබමු ඇයි තැන නොතැන කොමා
කඩිනම් කරනු වැඩ ටික තව නොකර පමා

කෙළ කෙළ කයිවාරු හිස්බස් නිතර කියා
හරියට මාස දහ අටකුත් අපතෙ ගියා
නිසි මග යායුතුය තතු දැන නොමග නොයා
ගුණදම් වඩමු කරුණාමෙත් මුදිත දයා


නැත කුඩුකේඩු ගති හෙළ බොදුවකුගෙ හිතේ
සමගිය වඩන මනුදම් හැම විටෙම ඇතේ
පහරන ගතිය නැත කෑමට ලැබෙන බතේ
එවැනිවු උතුම් ගති ඇත හෙළ පපුව මතේ

අපි හෙළයෝය කවදත් සමගියට ළැදී
සෙසු ජන කොටස් වුව රැකගයි නැසෙනු නොදී
නැහැ දෙස්පාලුවෝ නිසි ජාතකයකට හැදී
බලයට ගිජුව රට දස අත කරති හදී

## ලංකාවේ පාපන්දු පරිපාලනයට එරෙහිව ජනාධිපතිට පෙත්සමක්

ශ්‍රී ලංකාවේ පාපන්දු සම්මේලනයේ වත්මන් පරිපාලනයට එරෙහිව, උද්ඝෝෂණයක් පසුගියදා කොළඹ ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරිපිටදී පැවැත්විණි. මෙම විරෝධතාව සංවිධාන කරනු ලැබුවේ මෙරට පාපන්දු ක්‍රීඩාවේ සිටි ජාතික පුහුණුකරුවන්ගේ සහ ක්‍රීඩකයන්ගේ සන්ධානයක් මගිනි.

ඔවුන් මෙම උද්ඝෝෂණය හරහා කියා සිටියේ, මෙරට වත්මන් පාපන්දු පරිපාලනය දැඩි දූෂණයකට හා වංචාවකට ලක්වී ඇති බවයි. කිසිදු නිසි මූල්‍ය පරිපාලනයක් සම්මේලනය තුළ සිදුනොවන බවට ඔවුහු චෝදනා කරති. එසේම මෙවැනි වටාපිටාවක් යටතේ ශ්‍රී ලංකාවේ පාපන්දු ක්‍රීඩාවද විශාල පරිහානියකට ලක්වී ඇතැයිද විරෝධතාකරුවෝ කියා සිටිති. එසේම ඔවුන් වැඩිදුරටත් කියා සිටියේ ජනාධිපතිවරයා මැදිහත්ව මෙම තත්ත්වයට විසඳුමක් ලබාදිය යුතු බවයි.




විරෝධතාව අවසානයේ ජනාධිපතිවරයා වෙත විශේෂ පෙත්සමක් භාරදීම සිදුකෙරිණි. එම පෙත්සම නියෝජිතයන් විසින් ජනාධිපති කාර්යාලය වෙත භාරදෙන ලදී.

ප්‍රියන්ත හෙට්ටිගේ

PAGE - 01

## පොදු අපේක්ෂකයෝ රොත්තක්...

2029 ජනාධිපතිවරණයේදී පොදු අපේක්ෂකයන් ලෙස තරග වැදීමට සූදානමින් සිටින විපක්ෂයේ දේශපාලන නියෝජිතයන් කිහිප දෙනෙක් මුල්කරගෙන මේ වනවිට සමාජ මාධ්‍ය ඔස්සේ දැවැන්ත ප්‍රචාරක ව්‍යාපාරයක් ආරම්භ වී ඇති ආකාරයක් දැකගන්නට පුළුවන.

ඒ අනුව, පාඨලී චම්පික රණවක, හර්ෂ ද සිල්වා, මහාචාර්ය ජී.එල්. පීරිස්, විමල් වීරවංශ, දිලිත් ජයවීර, ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා යන මහත්වරුන්ගේ නම් මෙසේ විපක්ෂයේ පොදු අපේක්ෂකයා වශයෙන් සමජ මාධ්‍ය තුළ දැඩි ලෙස කතාබහට ලක්ව තිබේ.

මේ නම් අතරින් පාඨලී චම්පික රණවක මහතා දැනටමත් සිය ප්‍රචාරක ව්‍යාපාරය ආරම්භ කරමින් සාකච්ඡා, මාධ්‍ය හමු සහ සම්මන්ත්‍රණවලට සහභාගි වන ආකාරයක් දැකගන්නට පුළුවන.

එමෙන්ම ජී.එල්. පීරිස් මහතාද සිය නිවසේ මාධ්‍ය හමු සහ දේශපාලන සාකච්ඡා පවත්වමින් සිටින ආකාරයක් දැකගන්නට තිබේ.

එමෙන්ම දිලිත් ජයවීර සහ විමල් වීරවංශ යන මහත්වරුන් දැනටමත් ප්‍රකාශ කොට ඇත්තේ තමන්ද ඉදිරි ජනාධිපතිවරණයේ පොදු අපේක්ෂකයා ලෙස ඉදිරිපත් වීමට සැලසුම් කොට ඇති බවකි.

මීට අමතරව සමාජ මාධ්‍ය වාර්තා කොට ඇත්තේ සජබ භාණ්ඩාගාරික ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා හට එජාප නායකත්වය ලබාදීමට රනිල් වික්‍රමසිංහ මහතා තීරණය කොට ඇති බවත්, ඉන් අනතුරුව හර්ෂ ද සිල්වා මහතා විපක්ෂයේ පොදු අපේක්ෂකයා වශයෙන් ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇති බවත්ය.

එමෙන්ම ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතාද ඉකුත් වතාවේ මෙන්ම ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමට සූදානමින් පසුවන බවද සමාජ මාධ්‍ය වාර්තා කොට තිබේ.

කෙසේ වෙතත් අපට ඇති තොරතුරුවලින් නම් කියැවෙන්නේ 2029 ජනාධිපතිවරණයද 2024 ජනාධිපතිවරණය මෙන් තුන්කොන් සටනක් වනු ඇති බවකි.

ඒ අනුව ඊට මාලිමාව නියෝජනය කරමින් නැවත වතාවක් අනුර කුමාර දිසානායක මහතාත්, සමගි ජන බලවේගය නියෝජනය කරමින් විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාත්, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරමින් නාමල් රාජපක්ෂ මහතාත් 2029 ජනාධිපතිවරණයට තරග වැදීමට නියමිතය.

## පොහොට්ටුවෙන් දොට්ට...

ලැබී ඇති බව වාර්තා වේ. විශේෂයෙන්ම තිස්සකුට්ටි ආරච්චි මහතා සමගි ජන බලවේගය සහ එහි නායක සජිත් ප්‍රේමදාස මහතා ඉලක්ක කරගෙන සිදුකරනු ලබන අනවශ්‍ය ප්‍රකාශ පක්ෂයට ඉතා අහිතකර හා අවාසිසහගත ලෙස බලපාන බව පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන් නාමල් රාජපක්ෂ මහතා වෙත දැනුම් දී තිබේ.

මීට අමතරව අනුරාධපුර දිස්ත්‍රික් සංවිධායකවරයා වශයෙන් තිස්ස කුට්ටිආරච්චි මහතා කරනු ලබන ප්‍රකාශ සම්බන්ධයෙන් අනුරාධපුර පක්ෂ සාමාජිකයන්ද දැඩි විරෝධයක් පළකොට ඇති බවත්, මේ හේතුවෙන් පක්ෂ සාමාජිකයන් රැසක් දැනටමත් පක්ෂය හැරගොස් ඇති බවත් දැනගන්නට ඇත.

මීට පෙර අවස්ථා කිහිපයකදීම තිස්ස කුට්ටිආරච්චි මහතා කාන්තාවන් ඉලක්ක කරගෙන සිදුකරනු ලැබූ අපහාසාත්මක ප්‍රකාශ හේතුකොට ගෙන පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන් ඔහුට දැඩි ලෙස අවවාද කිරීමටද කටයුතු කොට තිබිණි.

ඒ අනුව, මේ වනවිට පොහොට්ටුවේ ජ්‍යෙෂ්ඨයන් තීරණය කොට ඇත්තේ පක්ෂයට හිසරදයක් වී ඇති තිස්ස කුට්ටිආරච්චි මහතා පොහොට්ටු සාමාජිකත්වයෙන් නෙරපා හැරීමටය.

## අනුර දිනයි...

මුල් මාස 18ක පාලන කාලය තුළ පාර්ලිමේන්තුවේ නීති සම්පාදන ක්‍රියාවලිය සැසඳීමේදී හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතා පරාජයට පත්කිරීමට වත්මන් ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා සමත්ව ඇති බව වේරිටේ රිසර්ච් ආයතනයේ නවතම දත්ත වාර්තාවක් පෙන්වා දෙයි.

පාර්ලිමේන්තු නිල දත්තවලට අනුව, පාලන සමයන් දෙකෙහිම මුල් මාස 6 සලකා බැලීමේදී මෛත්‍රීපාල සිරිසේනගේ පාලන සමය ඉදිරියෙන් සිටිමින් එම කාලය තුළ රජය පනත් කෙටුම්පත් 17ක් ගැසට් කර ඉන් 6ක් නීති බවට පත්කර තිබිණි.

නමුත් මාලිමා රජය රජය ගැසට් කර තිබුණේ පනත් 7ක් පමණි. ඉන් නීති බවට පත්ව තිබුණේ පනත් 3ක් පමණි.

කෙසේ වෙතත්, 9 වැනි මාසයේ සිට මෙම තත්ත්වය උඩුයටිකුරු කරමින් අනුර කුමාර දිසානායකගේ රජය නීති සම්පාදන වේගය වේගවත් කර ඇති බවක් දැකගන්නට ඇත.

ඒ අනුව, මාස 18 සීමාව සම්පූර්ණ වන විට (2026 මාර්තු වනවිට) මාලිමා රජය විසින් සම්මත කර ඇති මුළු නීති සංඛ්‍යාව 32කි. එය මෛත්‍රීපාල සිරිසේන ගේ මුල් මාස 18 තුළ සම්මත කළ නීති සංඛ්‍යාවට (20) වඩා පනත් 12කින් ඉහළ අගයකි.

මෛත්‍රීපාල සිරිසේනගේ මුල් මාස 18 තුළ වැඩිම පනත් සංඛ්‍යාවක් (54ක්) ගැසට් කරමින් පෙරමුණේ සිටියද, අනුර කුමාර දිසානායකගේ රජය (පනත් 50ක් ගැසට් කර) ඉන් වැඩිම ප්‍රතිශතයක් සාර්ථකව නීති බවට පරිවර්තනය කිරීමට සමත්ව ඇත.

## රනිල් එන්නේ නෑ...

හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා නැවත වතාවක් පාර්ලිමේන්තුවට පැමිණීමේ අදහසක් නොමැති බව හිටපු අමාත්‍ය රාජිත සේනාරත්න මහතා පැවැසීය.

රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවකට එක්වෙමින් සේනාරත්න මහතා පවසා සිටියේ දැනට වික්‍රමසිංහ මහතාගේ එවැනි කිසිදු අදහසක් නොමැති බවකි.

කෙසේ වෙතත් පසුගිය සති කිහිපය පුරාම රනිල් වික්‍රමසිංහ මහතා සමීපයේ සිටින බොහෝ දෙනකු මාධ්‍ය හමුවේ කියා සිටියේ රනිල් වික්‍රමසිංහ මහතා ඉදිරියේදී නැවත වතාවක් පාර්ලිමේන්තුවට පැමිණීමට සූදානමින් සිටින බවකි.

නමුත් රාජිත සේනාරත්න මහතා පැහැදිලිවම කියා සිටියේ රනිල් වික්‍රමසිංහ මහතා නැවත පාර්ලිමේන්තු පැමිණීමේ සූදානමක් නොමැති බවකි.

## ගස් පැළ වංචාවක්...

විවිධ ගස් වර්ග වගාකිරීම සඳහා ආයෝජනය කරන ලෙස යම් යම් සමාගම් සහ ආයතන විසින් කරනු ලබන යෝජනා සම්පූර්ණයෙන්ම නීති විරෝධී බව මහබැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ චතුරි ජයසිංහ මහත්මිය අවධාරණ කරයි.

ඇය අවධාරණය කර සිටින්නේ මෙවැනි වගාවන්ට කිසිසේත්ම මුදල් ආයෝජනය නොකරන ලෙසත්, එවැනි ආකාරයේ මුදල් එකතු කිරීම නීති විරෝධී බවත්ය.

මුදල් ව්‍යාපාර පනතේ වගන්ති අනුව මහ ජනතාවගෙන් එවැනි ආකාරයට මුදල් එකතු කිරීම සිදුකළ නොහැකි බව පෙන්වා දුන් ඇය, ඇතැම් ආයතන වල්ලාපට්ටා, කිලෝ පේර, නයි මිරිස්, වැනිලා, කොච්චි මිරිස්, කංකුං, වැනි වගාවන්ට ආයෝජන කරන ලෙස දැනුම් දෙමින් මහජනතාවගෙන් මුදල් එකතු කරන බවද සඳහන් කර සිටියාය.

## දිට්වා කුණාටුවට...

ආචාර්ය හර්ෂ ද සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා පාර්ලිමේන්තුවේ පැවැති මුදල් කමිටු රැස්වමේදී විගණකාධිපති දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් මේ බව අනාවරණ කරනු ලැබීය.
එහිදී ඔවුන් කියා සිටියේ රී බිල්ඩින් ශ්‍රී ලංකා නමින් අරමුදලක් හෝ නොමැති බවත්, එම අරමුදලට එකතු වූ මුදල් තවමත් මහා භාණ්ඩාගාරයේ පවතින බවත්ය.

## නවීන් සජබ එක්ක...

ඉදිරි පළාත් සභා මැතිවරණයේදී සමගි ජන බලවේගය සමග එක්ව මධ්‍යම පළාතේ මහ ඇමැති ධුරයට තරග කිරීමට තමන් සූදානම් බව එක්සත් ජාතික පක්ෂයේ උපසභාපති නවීන් දිසානායක මහතා පැවැසීය.

පසුගිය දිනක මාධ්‍ය හමුවේ අදහස් දක්වමින් ඒ මහතා කියා සිටියේ සමගි ජන බලවේගය සහ එක්සත් ජාතික පක්ෂය එක්ව ඉදිරි පළාත් සභා මැතිවරණයට තරග වදින්නේ නම් තමන් නිසැක වශයෙන්ම මධ්‍යම පළාත් මහ ඇමැති අපේක්ෂකත්වයට ඉදිරිපත් වන බවකි.




# එක රැයෙන් අළුව ගිය අහිංසකයන්ගේ ආරාමය

**ඒ වෙනකොටත් වෙසක් පෝය ඉවර වෙලා නෑ. වෙසක් හඳ අවපසට හැරෙන්න පටන් අරගෙන. රෑ අහසට එහෙන් මෙහෙන් එන අඳුරු වලාකුළු වෙලාවකට හඳ වහනවා. හඳ අමාරුවෙන් දඟලලා දඟලලා එළියට එනවා. ඈත තොරණක කවි කියන සද්දෙ ඈතට ඇහෙනවා. හුළඟට කලවම් වෙන කවි ගේ දොර අස්සට එබෙනවා.**

ඉඳහිට වැටෙන වැස්සක් විනාඩි තිහ හතළිහකට හැම දේම නතර කරනවා. දන්සල් හොයාගෙන පාරට බැස්ස මිනිස්සු තැන් තැන්වල නතර වෙලා අහසට දොස් කියනවා. අහස ඒ දොස් අහගෙන ඉන්න බැරිම තැන වැස්ස නවත්ත ගන්න, අහසට ඕවා මතක තියෙන්නෙ ටික වෙලාවයි, ආයෙත් වහිනවා. අහසට වගේම මිනිස්සුන්ටත් හුඟක් දේවල් අමතකයි. අපි හිටියෙ වතුර නැතුව. ගිනියම දරාගන්න බැරුව. සෙල්සියස්වලින් උණුහුම මැන්නම තිස්හතට තිස්අටට වැඩි අගයක්. ආණ්ඩුවෙන්ම උපදෙස් දුන්නා, ඒ රස්නෙන් අපේ ශරීරයයට වෙන හානිය ගැන කියමින්.

'පොඩි දරුවො, වැඩිහිටියො ඒ උණුසුමට නිරාවරණය කරන්න එපා' වගේ ඒවා කියමින්. ඒත් ඒ උණුසුම වැඩිම උණොත් සෙල්සියස් අංශක හතළිහක් වෙන්න ඇති. එතකොට නෝනාවරුනි මහත්වරුනි එක පාරම සෙල්සියස් අංශක හයසීයක් හත්සීයක් වෙන බුරබුරා නැගෙන ගින්නකට කෙනෙක්ට මුහුණ දෙන්න වුණොත්....?

එදා රාත්‍රිය වෙන්දා වගේම සෙනෙහසේ නවාතැනට ආවා. ඒකෙ හිටියෙ කවුරුවත්ම අයිතිකාරයො අයිතිවාසිකම් නොකියන වැඩිහිටියොම නෙමෙයි. සමහර අයට කවුරු හෝ කෙනෙක් හිටියා. ඒ අය මේ අයව තනි කරලා අතරමං කරලා කියලා මිනිස්සු චෝදනා කරනවා. ඒක වැරදියි. අගක් මුලක් නොදැන ඔහේ කියවන ෆේස්බුක්කාරයො දන්නෙ නෑ සෙනෙහසේ නවාතැනට වැඩිහිටියෙක්ව දාන්න සාමාන්‍ය තත්ත්වය යටතේ මුදලක් අයකරනවා. ඒ මුදල රුපියල් තිස්පන්දහසට ආසන්න බවයි දැනගන්න ලැබෙන්නෙ.

ඒත් එහෙම නැතිව කීපදෙනෙක්ව නවත්වාගෙන උන්නා කියලා සමහරු කියනවා. දැන් ඒවා හොයන්න හෝ අහන්න විදියක් නෑ. මේ වෙනකොට සෙනෙහසේ නවාතැන අළුවෙලා ගිහිල්ලා. සියල්ල කඩාවැටිලා. මෙහි හිමිකරු සහ පාලකයා විදියට කටයුතු කළ පුද්ලයා අත්අඩංගුවට පත්වෙලා. ඒ නිසා ගණන් හිලව් හොයලා බලන්න හෝ පාලනය ප්‍රශ්න කරන්න මේක වෙලාවක් නෙවෙයි. ඒත් මෙතැනට ආව සමහර නෑදෑයෝ බොහෝ කතන්දර කියන බව සමාජ මාධ්‍යවල සටහන් වෙලා තිබුණා.

'බලන්න දෙන්නෙ මාසෙකට වරක්...'

'ඒ දවසට විතරක් ලස්සනට තියනවා...'

'අනිත් දවස්වල සලකන්නෙ නෑ..'

එතකොට අපිට අහන්න තියෙන්නෙ,

'තොපි ඕක කියන්න ගිනිගන්න කල්ම හිටියෙ අහවල් එකකටද?' කියලා. මොකද මේ ප්‍රශ්න විසඳගන්න තිබුණා. එහෙම බැරිනම් නීතිමය පියවරක් හරි ගන්න පුළුවන්. මේ දෙකම බැරි නම් වැඩිහිටියන්ව මෙතැනින් අයින් කරගන්න ඕනෙ. ඒත් ඒක කරන්න පවුල්වල අය කැමැති නෑ. ඒ අවදානමක් ගන්න තියෙන අකැමැත්ත. අන්න ඒ අකැමැත්ත ගැන මේ පාලකයෝ දැන ඉන්න ඇති. ඒ නිසාම මේ වැඩිහිටියන්ව 'අයින් කරගනී...' කියන අවදානම ඔවුන්ට නෑ. හුඟක් අය කියනවා මේ වැඩිහියො නටමින්, ගී ගයමින් සතුටින් හිටියාය කියලා. ඒ අයගෙ වීඩියෝ හෝගාලා සමාජ මාධ්‍යවලට දානවා කියලත් කියනවා. අපි දන්න විදියට නම් එහෙම දාන්න පවා තහනම්. ඒත් ඒක එහෙම වෙලා තිබුණා. දෙයක් වෙනකල්ම ඉන්න ඕනේ හැමෝම ඕවා ගැන හොයන්න වගේ කතාවක් කියලා තර්ක කරන්න දැන් පුළුවන්.

ඇත්තටම මේ වගේ තත්ත්වයක් යටතේ වැඩිහිටි පිරිසක් බලාගන්න එක ලේසි නෑ.

'ඉතින් බැරි නම් නිකන් ඉන්න එපායැ...' වගේ එකක් කියන්න පුළුවන්. ඔව්, ඇත්තටම වැඩිහිටියො හැත්තෑවක් රඳවාගෙන ඉන්න තැනක මීට වඩා සිය දහස් ගණනක ආරක්ෂාවක් ඕනේ. මේ වෙලාවෙ හදිසියෙම මතුවෙන සමහර අමානුෂික දේවල් මේ වගේ තැනක නොවී බෑ වගේ තර්කයක් සමාජය විසින් නිර්මාණය කරමින් ඉන්නවා. එහෙම වැඩිහිටියො බැඳලා තියන්න පුළුවන්ද? එහෙම තියනවා නම් ඒ කුමන සීමාවක් යටතේද? එයාලව ලෙහන්නෙ මොන වෙලාවටද? දවසට කී වතාවක්ද? වගේ බරපතළ ප්‍රශ්න පේන්න තියෙනවා, ඒවා එකින් එක බේරගන්න වෙනවා.

> **'අපි කොච්චර උපදෙස් දුන්නත් අයිතිකරු ඒවා ගණන් ගත්තේ නෑ'**
> **මිල්ලනිය ප්‍රාදේශීය ලේකම්**
>
> **'මම මේ පුද්ගලයාව අවස්ථා ගණනාවකදීම ගෙන්නලා අවවාද කළා. හැබැයි මම කිව්වට ඒ අදාළ දේවල් ඔහු කරන්නෙ නෑ. එහෙම නොකළාම එතැනින් එහාට මට ගන්න ඇක්ෂන් එකක් නෑ. ඔය නිවාසයට අවස්ථා ගණනාවකදී මමම ගිහිල්ලා සෑහෙන්න උපදෙස් දුන්නා. ආරක්ෂාවට ගන්න ඕනෙ පියවර කිව්වා. ඊට පස්සේ ඒ පුද්ගලයා ඔෆිස් එකට ගෙන්නුවා. ඒත් ඔහු කළේ නෑ. ඉන් පසු මොහු මම කියන දේ අහන්නේ නෑ කියලා අදාළ ආයතන සියල්ල මම දැනුවත් කළා...'**
>
> **අඟුරුවාතොට ඛේදවාචකය ගැන මිල්ලනිය ප්‍රදේශීය ලේකම්තුමිය මෙසේ අදහස් දැක්වූ බවට සමාජ මාධ්‍ය තුළ පළකර තිබිණි.**

මේක මේ නිවාසයට විතරක් නෙවෙයි. මුළු රටටම බලපාන ප්‍රශ්නයක්. පවත්වාගෙන යන නිවාස 148ක් තිබේ. කෙසේ වෙතත්, දිවයින පුරා පවත්වාගෙන යන සමස්ත වැඩිහිටි නිවාස සංඛ්‍යාව 456ක් පමණ බව කියවෙනවා. තවමත් නිසි ලියාපදිංචියක් නොමැතිව ක්‍රියාත්මක වන ආයතන 300කට අධික ප්‍රමාණයක් පවතින බව වාර්තාවෙනවා. ඒ ගණන කිසිවෙක්ට නිසි ලෙස ගණන් බලන්න බෑ. ළමා නිවාසවලත් තත්ත්වය ඒකම තමයි. ලංකාවෙ බහුලවම තියෙන්නෙ ස්වේච්ඡා ළමා නිවාස. ඒවා පුද්ගලික හිමිකරුවන් හෝ රාජ්‍ය නොවන සංවිධානවලින් පවත්වාගෙන යන ඒවා. එවැනි ළමා නිවාස හාරසීයකට ආසන්න ප්‍රමාණයක් වෙන කොට රජය මගින් පාලනය වෙන නිවාස ගණන දහයක් පහළොවක් පමණ බවයි දත්ත මගින් දැනගන්න ලැබෙන්නෙ. ඒ අනුව වැඩිහිටි නිවාසවලට වඩා මේ තත්ත්වය බොහෝම නරකයි.

හැබැයි ළමා නිවාසයක් ගිනිගත්තෙ නැති නිසා අපි ළමා නිවාස ගැන කියන්න යන්නෙ නෑ. අපි දැනට වැඩිහිටි නිවාස ගැන විතරක් කවි ගී ලියමු. දෙයක් වුණු දවසට ළමා නිවාස ගැනත් මොනවා හරි කියමු.

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය කියලා ආයතනයක් ලංකාවෙ තියෙනවා. වැඩිහිටි නිවාස ලියාපදිංචි කිරීම, ඒවායේ ප්‍රමිතීන් නියාමනය කිරීම සහ වැඩිහිටි අයිතිවාසිකම් සුරැකීම සඳහා ඉහත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ප්‍රධානතම රාජ්‍ය ආයතනය මේක බවයි දැනගන්න ලැබෙන්නෙ. ලංකාවේ බොහෝ වැඩිහිටි නිවාස සහ දිවා සුරැකුම් මධ්‍යස්ථාන නඩත්තු කිරීම හා ප්‍රාදේශීය මට්ටමින් අධීක්ෂණය කිරීම අදාළ පළාත් සභා සමාජ සේවා දෙපාර්තමේන්තු මගින්ද සිදුවෙනවා. සමාජ සේවා නිලධාරීන් තුන්සිය පනහකට අධික ප්‍රමාණයක් ඉන්නවා. ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට එක් අයෙක් වශයෙන් 331ක් සහ විශේෂ නිලධාරීන් 20ක්. ඒ අයට වගකීමක් තියෙනවා මේ සම්බන්ධව හොයලා බලන්න.

ඒ වගේම දැන්වත් පටන් ගන්න ඕනෙ වැඩ ගොඩක් තියෙනවා. මීට කලින් දිට්වා සුළි කුණාටුව වෙලාවෙ මාඔය ඉවුරේ වැඩිහිටියන් රැසක් මියගියා. ඒ අයව නිවැරදිව ඉවත් කරගත්තා නම් මේ තත්ත්වය වෙන්නෙ නෑ. ඒවා ඉතාම අවශේෂ සිදුවීම් විදියට අපි අමතක කළා. හෙට ආයෙත් දෙයක් වුණාම මාසයක් දෙකක් කතා කරයි. ඊට පස්සෙ ඉවරයි.

ඊළඟ ප්‍රශ්නය? කුමන හෝ තත්ත්වයක් යටතේ මහමග ජීවිතේ ගෙවන මිනිස්සු වෙනුවෙන් අපි කිසිම දවසක වැඩපිළිවළක් හදන්නෙ නෑ. ඒ මිනිස්සුන්ට හඬක් නෑ. ඒ මිනිස්සුන්ට අයිතිකාරයො නෑ. ඇත්තටම ඒ අය සමාජයට පවා ලොකු අවුලක්. හැම නගරයකම එවැනි අය කීපදෙනෙක් ඉන්නවා. ඒ අය ඉතාම දරුණු ගැටලු මැද කොහොම හරි ජීවත් වෙනවා. රටක එහෙම වෙන්න පුළුවන්ද? පුළුවන් ඇමෙරිකාවෙ පවා 'නිවාස නැති මිනිස්සු' කියන ප්‍රශ්නය තියෙනවා. ඒත් මේ වැඩිහිටි නිවාස නියාමනය හරහා මේ ප්‍රශ්නයට උත්තරයක් හොයන්න අපිට බැරිකමක් නෑ. ඒක අසීරු වුණත් නිසි ක්‍රමවේදයක් යටතේ කරන්න බැරි නෑ.

මේ මියගිය 13 දෙනාගෙ මරණ ඉතාම වේදනාකාරී බව ඇත්ත. සමහරු මියගියෙ දම්වැල්වලින් බැඳලා තියෙද්දි බව අහන්න ලැබෙනවා. සමහරු ඉඳගත්ත පුටුවෙම පිච්චිලා. රෝහල්ගත කළාට පස්සෙ මියගියේ එක් අයෙක් හෝ දෙන්නෙක්. අනිත් අයව හොයාග න්නෙම පිලිස්සිලා අවසන් වුණාම. ඒක එහෙම වෙන්න බෑ.

අඩුම තරමෙ හදිසියකදී මුලින්ම අවදානය තියෙන්නෙ ඕනෙ ඇඳන්වල බැඳලා දාපු අය ගැන. බේරගන්න ආපු මිනිස්සු ඒ ගැන දන්නෙ නෑ. ඒක දන්නෙ පාලකයෝ. හේතු ඕනෙ තරම් ඇති. ඒත් ගින්නෙන් පිච්චුණේ මිනිස්සු. ඔබ අප වගේම මිනිස්සු. ඒ මිනිස්සු කොච්චර කෑගහන්න ඇතිද? කොච්චර උදව් ඉල්ලන්න ඇතිද? අතපය බැඳපු බැමි ගලවගන්න දඟලලා දඟලලා බැරිම තැන ඇස් දෙක පියාගන්න ඇති. මහා ගින්නකින් අමු මස් පිච්චෙන වේදනාව විනාඩි ගානක් ඇස් පියාගෙන දරාගන්න ඇති. අවුරුදු ගානක් තිස්සෙ අල්ලපු ඇඳේ ජීවිතේ බෙදාගත්ත කෙනා ගිනි අරගෙන ඉවර වුණාම, ඊ ළඟට මගේ වාරය කියලා ඒ මිනිස්සු හිතන්න ඇති.

'එයාලව මෙතැනට ගෙනාපු අය වැරදියි...' කියලා මම කියන්නෙ නෑ. මේ ක්‍රමයත් එක්ක ඇත්තටම මිනිස්සු ඒ තත්ත්වයට වැටෙනවා. ඒත් ඒක එහෙම නොවෙන්න තිබුණා. මේ වෙසක් හඳ යට ඒ ගින්දර නොඇවිළෙන්න තිබුණා. හෙට අනිද්දා මේ ගින්නට හේතුව හොයාගනී. ඒ මළසිරුරු ටික වළලලා දායි. කතාව එතැනින් ඉවරයි. හැමදාම වුණේ එහෙම.


ජීවන පහන් තිළිණ

ජනාධිපතිතුමනි, මේ වෙලාවෙ ප්‍රශ්න ගොඩක් තියෙනවා. ඒක අපි දන්නවා. ඒත් මේ ගින්නට උත්තර හොයන්න. ඇත්තටම මේ මිනිස්සු පිච්චෙන්න ගත්තෙ අදක ඊයෙක නෙමේ. ඒ මිනිස්සු අවුරුදු විස්සක තිහක කාලයක් තිස්සෙ ඇවිළෙනවා. රට පුරාම එහෙමයි. මිනිස්සු පිච්චෙනවා. පුළුවන් නම් ඒ ගින්දර නිවන්න. නැත්නම් අපි විතරක් නෙවෙයි ඔයාලත් පිච්චෙනවා.

---

# අඩි තුනක් උස මස් ඉරාගෙන කාපු අද්භූත නිත්තෑවෝ නැත්තටම නැති වුණාද?

**රාත්‍රී කාලයේ මහ කැලෑවක් මැද තියෙන ගල් ගුහාවක් ඇතුළට වෙලා, ගින්දර ගොඩක් වටකරගෙන බයෙන් ගැහෙමින් ඉන්න මිනිස්සු රංචුවක් ගැන මොහොතකට හිතන්න. ඒ අය බයවෙලා හිටියේ කැලේ ඉන්න අලියෙකුටවත්, කොටියෙකුටවත්, වළහෙකුටවත් නෙවෙයි. ඒගොල්ලෝ බයවෙලා හිටියේ ඝන අඳුර අස්සේ ගස් අතු අතරින්, කුරුල්ලන්ගේ වගේ අමුතුම කෑගැහිලි ශබ්ද කරගෙන එන, මනුෂ්‍යයන්ට වඩා හාත්පසින්ම වෙනස්, අඩි තුනක් විතර උස අද්භූත ගෝත්‍රයකට.**

ලෝක ප්‍රසිද්ධ 'ලෝඩ් ඔෆ් ද රිංග්ස්' චිත්‍රපටයේ ඉන්න 'හොබිට්ස්'ලා වගේ අමුතුම වාමන මානව කොට්ඨාසයක් ලංකාවේ ඝන කැලෑවල් අස්සෙත් ජීවත් වුණා කිව්වොත් ඔබ විශ්වාස කරනවාද? මේක නිකම්ම නිකන් ජනප්‍රවාදයක් නෙවෙයි. යුරෝපීය මානව විද්‍යාඥයන් පවා මවිතයට පත්කරපු අපේ ඉතිහාසයේ කවුරුත් නොකියන අඳුරු රහසක්.

ඒ තමයි කුමන, මහලේනම ඝන කැලෑවේ ආධිපත්‍යය පැතිරුවා යැයි කියන අද්භූත 'නිත්තෑවෝ' (Nittaewo).

### කවුද මේ භයානක නිත්තෑවෝ?

බ්‍රිතාන්‍ය පර්යේෂකයන්ගේ වාර්තාවලට සහ පැරණි වැදි ජනප්‍රවාදවලට අනුව, නිත්තෑවෝ කියන්නේ වඳුරන් විශේෂයක් නෙවෙයි. ඔවුන් මිනිසුන්ට සමාන, නමුත් අපිට වඩා ගොඩක් වෙනස් වාමන මානව විශේෂයක්.

පෙනුම: ඔවුන්ගේ උස උපරිම අඩි 3ක් පමණ වුණා. ඇඟ පුරාම ඝන රෝම තිබුණු අතර, කෙළින් හිටගෙන ගමන් කිරීමේ හැකියාව ඔවුන්ට තිබුණා.

භාෂාව: ඔවුන්ට කතාකිරීමට නිශ්චිත භාෂාවක් තිබුණේ නැහැ. ඒ වෙනුවට ඔවුන් එකිනෙකා අදහස් හුවමාරු කරගත්තේ පක්ෂීන්ගේ නාදයට සමාන අමුතුම ශබ්ද තරංග හරහායි.

### ආයුධ නැති මාරාන්තික දඩයක්කාරයෝ

වැදි ජනතාව දුනු ඊතල පාවිච්චි කළත්, නිත්තෑවෝ කිසිම ආයුධයක් පාවිච්චි කළේ නැහැ. ඔවුන්ගේ ප්‍රධානම ආයුධය වුණේ ඔවුන්ගේ අත්වල පිහිටලා තිබුණු අතිශය තියුණු, වක්‍ර වුණු දිගු නියපොතුයි. සතුන්ව මරාගෙන, ඒ නියපොතුවලින් මස් ඉරාගෙන කන්න තරම් ඔවුන් රුදුරු වුණා.

### මහලේනම කැලෑවේ සිදුවූ ලේ වැකි යුද්ධය

කාලයක් යද්දී මේ මහලේනම කැලෑවේ හිටපු වැදි ජනතාවට නිත්තෑවන්ගෙන් විශාල තර්ජනයක් එල්ල වෙන්න පටන් ගත්තා. වැද්දන් දඩයම් කරලා වේළෙන්න දාන මස්, මේ නිත්තෑවන් රංචු පිටින් ඇවිත් හොරකම් කළා. ඊටත් වඩා භයානකම දේ වුණේ, කැලෑවේ තනියම යන වැදි දරුවන්ව මේ නිත්තෑවන් විසින් පැහැරගෙන යාමයි.



### නිත්තෑවන්ට අත්වූ ඛේදනීය ඉරණම

තමන්ගේ දරුවන්ව පවා අහිමි වෙන තැනට ආවම, වැදි ජනතාවට වෙනත් විකල්පයක් තිබුණේ නැහැ. ඔවුන් කැලේ හිටපු සියලු වැද්දන්ව එකතු කරගෙන අතිශය භයානක තීරණයක් ගත්තා.

එක්තරා දවසක ඔවුන් කැලෑවේ හිටපු සියලු නිත්තෑවන්ව වටකරලා, එක දැවැන්ත ගල් ගුහාවකට පන්නා ගත්තා. ඉන්පසු ඒ ගුහාවේ කටට දර සහ කොළ අතු ගොඩගහලා, සම්පූර්ණයෙන්ම පිටවෙන්න බැරිවෙන්න වහලා ගිනි තිබ්බා. එක දිගට දින 3ක් පුරාවට ඒ ගින්න ඇවිළුණා. ඇතුළෙන් ආපු ඒ අද්භූත කෑගැහිලි ක්‍රමයෙන් නිහඬ වුණා. එදායින් පස්සේ ඒ අද්භූත වාමන ගෝත්‍රය මේ ලෝකයෙන් සදහටම සමුගත්තා.


### මේක විද්‍යාත්මකව ඔප්පු වෙලා තියෙනවාද?

මෙය හුදෙක් කතන්දරයක් පමණක් නොවේ. 1887 දී බ්‍රිතාන්‍ය ජාතික පර්යේෂකයකු වූ හියු නෙවිල් මේ පිළිබඳ ලෝකයට මුලින්ම වාර්තා කළා. ඒ වගේම අපේ ප්‍රවීණ විද්‍යාඥයකු වූ මහාචාර්ය පී.ඊ.පී. දැරණියගල මහතාත් මේ පිළිබඳ පුළුල් පර්යේෂණ සිදුකළා.

ඊටත් වඩා පුදුමසහගත කරුණ වන්නේ, මෑතකදී ඉන්දුනීසියාවේ ෆ්ලෝරස් දූපතෙන් සොයාගත්, Homo floresiensis හෙවත් අඩි තුනක් පමණ උසැති වාමන මානවයාගේ ෆොසිලයි. මෙම සොයාගැනීමත් සමග අද ලෝකයේ මානව විද්‍යාඥයන් පවා විශ්වාස කරන්නේ, ලංකාවේ වැදි ජනප්‍රවාදවල එන මේ නිත්තෑවෝ යනු අතීතයේ ජීවත්වී වඳවී ගිය එවැනිම සැබෑ මානව විශේෂයක් විය හැකි බවයි.

### 'නිට්ටාවටම සුව වුණා' කියන කතාව හැදුණේ මුන් නිසාද?

සමාජයේ පැතිරිලා තියෙන ලොකුම මිථ්‍යාවක් තමයි 'නිට්ටාවටම සුව වුණා' (ලෙඩක් සම්පූර්ණයෙන්ම සුව වුණා) කියන වචනය හැදුණේ මේ නිත්තෑවන්ගෙන් බේරුණු නිසා කියන කතාව. හැබැයි භාෂා විද්‍යාත්මකව බැලුවම ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. 'නිට්ටාවටම' කියන වචනය හැදෙන්නේ පාලි/සංස්කෘත භාෂාවේ එන 'නිෂ්ඨා' (අවසානය/සම්පූර්ණ වීම) කියන මූලයෙන්. හැබැයි 'නිත්තෑවෝ' කියන නම හැදිලා තියෙන්නේ උන්ගේ අර අතිශය දිග නියපොතු තිබුණු නිසා 'නිය-ඇවෝ' (නියපොතු ඇත්තෝ) එකතු වෙලයි.



*විස්මිත ලෝකය*

මව්රට
ලිපිනය නො: 22, ජයරත්න මාවත, කොළඹ 05
කර්තෘ මණ්ඩලය 0112505134
ඊමේල් news@mawratanews.lk
වෙබ් අඩවිය www.mawratanews.lk
බෙදාහැරීම් 0764 449 688
දැන්වීම් 0114870063

උපුල් ජෝෂප් ප්‍රනාන්දුගේ

## ගුරුදු විග්‍රහය



# 2005 සහ 2007 වගේ ජවිපෙ ආණ්ඩුවෙන් ගැලවෙයිද?

**'ජේ.වී.පී. එකත් එක්ක ආණ්ඩු හදන්න යන්න එපා මැඩම්. ආණ්ඩුවයි රටයි දෙකම ස්වභාවික ව්‍යසනයකට යනවා...'**

මේ, 2004 එවක ජනාධිපති චන්ද්‍රිකා, ජවිපෙ එක්ක එකතු වෙලා මහ මැතිවරණයට තරග කරන්න යන වෙලාවේ ජ්‍යොතිෂවේදියෙක් ඇයට දුන්න උපදේශයය. ඒත් චන්ද්‍රිකා ඒ උපදේශය ගණන් ගත්තේ නැත. ඇයට ඕනෙ වුණේ රනිල්ගේ ආණ්ඩුව වට්ටවලා රනිල් සහ යූ.ඇන්.පී.ය ගෙදර යවන්නටය. ඇය ජවිපෙ සමග ගිවිසුමක් අස්සන් කොට එක්සත් ජනතා නිදහස් සන්ධානය බිහිකොට මහ මැතිවරණයට ගිහින් දින්නාය.

2004 මහ මැතිවරණය 2024 ජවිපෙ දින්න මහ මැතිවරණය මෙන් දේශපාලන සුනාමියක් විය. බණ්ඩාරනායකවරුන්ගේ ඔටුන්න හිමි කුමරා අනුර බණ්ඩාරනායක ගම්පහ දිස්ත්‍රික්කයේ මනාප ලැයිස්තුවේ දෙක විය. එක වූයේ ජවිපෙ විජිත හේරත්ය. අනෙක් දිස්ත්‍රික්කවලද ශ්‍රීලනිප පතාකයන් දෙක වී ජවිපෙ අපේක්ෂකයන් එක විය. ශ්‍රීලනිපයේ පතාකයන් බොහොමයකට පාර්ලිමේන්තුවට තේරී පත්වීමටද නොහැකි විය. ඔවුන්ගේ තැන ජවිපෙ හිමිකරගෙන ජවිපෙ ආසන 41ක් දිනාගත්තේය. ඒ ප්‍රතිඵලයෙන් චන්ද්‍රිකා පමණක් නොව ශ්‍රීලනිපයම හොල්මන් විය. ජවිපෙ මන්ත්‍රීවරුන් වූ අනුර කුමාර, විජිත හේරත්, ලාල්කාන්ත, චන්ද්‍රසේන විජේසිංහ කැබිනට් ඇමැති ධුරවල දිවුරුම් දුන්හ. බිමල් රත්නායක, සමන්ත විද්‍යාරත්න, සුනිල් හඳුන්නෙත්ති, නිහාල් ගලප්පත්ති නියෝජ්‍ය ඇමැති ධුරවල දිවුරුම් දුන්හ.

කැබිනට් මණ්ඩලය පත්කළ විගස චන්ද්‍රිකා සහ ජවිපෙ අතර ගැටුමක් නිර්මාණය විය. එයට හේතුව අනුර කුමාර සිය කෘෂිකර්මාන්ත අමාත්‍යාංශයට මහවැලි අමාත්‍යාංශය ඉල්ලා සිටීමය. එහෙත් එවක ශ්‍රීලනිප ලේකම් මෛත්‍රීපාල ඒ අමාත්‍යාංශය තමන්ට හිමි කරගෙන තිබූ අතර, ඒ අමාත්‍යාංශය අනුරට දෙන්න අකැමැති විය.

ඒ, පළමු ගැටුමය. ඊළඟට පාඩු ලබන රාජ්‍ය ආයතන පුද්ගලීකරණය කරන්න චන්ද්‍රිකා ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවලට කැබිනට් මණ්ඩලයේදී ජවිපෙ ඇමැතිවරු විරුද්ධ වූහ. චන්ද්‍රිකා, ජවිපෙ කොන්දේසි මත අයි.එම්.එෆ්. සහ ලෝක බැංකුව සමග ගනුදෙනු කිරීම නතර කර තිබිණි. අයි.එම්.එෆ්. සිය කොළඹ කාර්යාලය වසාදමා ලංකාවෙන් පිටව ගොස් තිබිණි.

සුනාමිය ලංකාව ගිලගත්තේ මෙන්න මේ කාලයේය. සුනාමියෙන් ලංකාවම කම්පනයට පත්විය. සුනාමියෙන් ලංකාව ගොඩගැනීමට ආධාර පැකේජයක් ඇමෙරිකාව, බ්‍රිතාන්‍යය සහ යුරෝපය, නෝර්වේ මැදිහත් වීමෙන් යෝජනා කළ අතර, සහන පැකේජය ගන්න ආණ්ඩුවත් එල්.ටී.ටී.ඊ.යත් යාන්ත්‍රණයක් හදාගත යුතු යැයි නිර්දේශ කළේය. ආණ්ඩුවේ නියෝජිතයන් සහ එල්.ටී.ටී.ඊ. නියෝජිතයන්ගෙන් සමන්විත සුනාමි සහන මණ්ඩලය නොහොත් පී-ටොම්ස් කරළියට ආවේ එසේය. ආණ්ඩුව

### චන්ද්‍රිකා මහින්ද එක්ක ජවිපෙ ගහපු ගිවිසුම්

සහ එල්.ටී.ටී.ඊ.ය අතර සාකච්ඡා සඳහා මැදිහත්කරු වූයේ නෝර්වේය.

ජවිපෙ චන්ද්‍රිකා සමග 2004 මහ ඡන්දයට එකතු වෙලා යන්න ගිවිසුම් ගැහුවේ රට පාවාදෙන කිසිදු ගිවිසුමකට එල්.ටී.ටී.ඊ.ය සමග අස්සන් නොකරන කොන්දේසිය මතය. ඒ වගේම නෝර්වේ මැදිහත් වීමෙන් එල්.ටී.ටී.ඊ.ය සමග සාකච්ඡා නොකරන කොන්දේසිය මතය. චන්ද්‍රිකා මේ කොන්දේසි සියල්ල කඩ කළාය.

මේ වෙනකොට ජවිපෙ අභ්‍යන්තරයෙන් ජවිපෙ නායකයන්ට ලොකු බලපෑමක් එල්ල වෙමින් තිබුණේ චන්ද්‍රිකාත්, ආණ්ඩුවත් සුනාමි ව්‍යසනය නිසා දිනෙන් දින ජනතා අප්‍රසාදයට පත්වන නිසා ආණ්ඩුවෙන් ඉවත් විය යුතු බවටය. කැබිනට් මණ්ඩලයේදී චන්ද්‍රිකා සමග ගැටුම් ඇතිකර ගත්තත් ආණ්ඩුවෙන් එක වරම ඉවත් වෙන්න ජවිපෙ බය විය. චන්ද්‍රිකාගෙයි ආණ්ඩුවෙයි කුණු කරගහගෙන දවසින් දවස ජනතා අප්‍රසාදයට පත් නොවිය හැකි නිසා නිලය අල්ලා ආණ්ඩුවෙන් ඉවත් වීමට ජවිපෙ තීරණය කරනු ලැබීය. චන්ද්‍රිකාගේ සුනාමි සහන මණ්ඩලය ඒ සඳහා ජවිපෙට හොඳ අවස්ථාවක් විය. අඬන්න ඉන්න බබාට ඇඟිල්ලෙන් ඇන්නා සේ චන්ද්‍රිකා සුනාමි සහන මණ්ඩලය අස්සන් කළ විට ජවිපෙ ආණ්ඩුවෙන් ඉවත් විය.

ජවිපෙ ඉවත් වූයේ වීරයන් මෙන්ය. යළි ජවිපෙ වටා මිනිස්සු එක්රොක් වෙන්න පටන් ගත්හ. ජවිපෙ මහින්ද රාජපක්ෂව ජනාධිපති කරන්නේ ආණ්ඩුවෙන් ඉවත් වීමෙන් ලබාගත් පන්නරය පාවිච්චි කරලාය.

මහින්දව ජනාධිපති කිරීමෙන් පසු ජවිපෙ මහින්දගේ ආණ්ඩුවේ ඇමැතිකම් ගන්නවාද යන්න ගැන දෙගිඩියාවෙන් සිටියහ. මහින්දත් ජවිපෙට ඇමැතිකම්දී ආණ්ඩුව තුළ අර්බුද හදාගන්න කැමැති නොවීය. මේ වෙනකොට මහින්දත් නෝර්වේ මැදිහත් වීමෙන් යළි එල්.ටී.ටී.ඊ.ය සමග සාම සාකච්ඡා පටන්ගෙන ජවිපෙ දැඩි අපහසු තත්ත්වයකට පත්කොට තිබිණි. මහින්ද එල්.ටී.ටී.ඊ.ය සමග කරන සාකච්ඡා නිසා තම සායම යන බව ජවිපෙ තේරුම්ගෙන සිටියේය.

චන්ද්‍රිකාගෙන් වෙන්වී විපක්ෂයට ගියා සේ මහින්දගෙන් වෙන්වී විපක්ෂයට ගියොත් ජනතාව ඉදිරියේ ජවිපෙ විහිළුවක් බවට පත්වෙන නිසා මහින්දව යුද්ධයට තල්ලු කරගන්න ජවිපෙ සමත් විය. ඒත් මහින්ද යුද්ධය

> **ඒත් මහින්ද යුද්ධය පටන්ගත් මුල් කාලයේ මහින්දට එල්.ටී.ටී.ඊ. ගුවන් ප්‍රහාරවලට සහ දරුණු පරාජයන්ට මුහුණ දීමට සිදුවිය. රටේ යුදමය වාතාවරණය නිසා ආර්ථිකය අර්බුදයකට ගොස් මිනිස්සු පීඩනයට ලක්විය. ලෝක ආර්ථික අර්බුදයේ බලපෑමෙන්ද ලංකාව පීඩාවට පත්විය. ජවිපෙ ගණන් හැදීම වූයේ මහින්දට යුද්ධය දිනන්න බැරි බවය.**

පටන්ගත් මුල් කාලයේ මහින්දට එල්.ටී.ටී.ඊ. ගුවන් ප්‍රහාරවලට සහ දරුණු පරාජයන්ට මුහුණ දීමට සිදුවිය. රටේ යුදමය වාතාවරණය නිසා ආර්ථිකය අර්බුදයකට ගොස් මිනිස්සු පීඩනයට ලක්විය. ලෝක ආර්ථික අර්බුදයේ බලපෑමෙන්ද ලංකාව පීඩාවට පත්විය. ජවිපෙ ගණන් හැදීම වූයේ මහින්දට යුද්ධය දිනන්න බැරි බවය.

යුද්ධය දිගට ඇදුණොත් රට ආර්ථික අගාධයකට ගොස් එහි වගකීම තම කර මත වැටෙයි කියන බයටත්, මහින්ද ජවිපෙ තුළ සිටි විමල් වීරවංශ වැනි දේශප්‍රේමීන් කඩන නිසා හටගත් වෛරයටත් 2008 මහින්දගේ අයවැය පරාජය කොට ආණ්ඩුවෙන් ඉවත් වෙන්න ජවිපෙ තීරණය කළේය. ඒත් ඊට පෙර මහින්ද ජවිපෙ දෙකඩ කොට අයවැය සම්මත කරගත්තේය.

චන්ද්‍රිකාවත් මහින්දවත් බලයට ගෙනැවිත් ජවිපෙ ඔවුන්ගෙන් වෙන්වන්නේ ඔවුන් සමග ආණ්ඩු කරන්න ගොස් ඔවුන්ගේ පාපකර්මවලට කරගහන්න බය නිසාය.

හැබැයි අද තියෙන්නේ ජවිපෙ නායක අනුර ජනාධිපති ධුරය දරන ජවිපෙ ආණ්ඩුවකි. අද අනුරගේත්, ආණ්ඩුවේත් පවු ඔක්කොටම කරගහන්න වෙලා තියෙන්නේ ජවිපෙටය.

'චන්ද්‍රිකාගෙන් මහින්දගෙන් වෙන්වුණා වගේ ජවිපෙට අනුරගෙන් වෙන්වෙන්න පුළුවන්ද...?'

අනුර ජවිපෙ නායකයාය. ජවිපෙ චන්ද්‍රිකාගෙන් වෙන්වන විට චන්ද්‍රිකා ශ්‍රීලනිප නායිකාවය. මහින්දගෙන් වෙන්වන විට මහින්ද ශ්‍රීලනිප නායකයාය. ජවිපෙට චන්ද්‍රිකාගෙන් මහින්දගෙන් වෙන්වුණා වගේ අනුරගෙන් වෙන්වෙන්න බැරිය. අනුරගෙන් වෙන්වෙන්න නම් ජවිපෙ අනුරව පක්ෂ නායකත්වයෙන් ඉවත් කොට අලුත් නායකයෙක් පත්කරගත යුතුය.


ජවිපෙ අනෙක් පක්ෂ වගේ නොවේ. ඕනෑම

### ජවිපෙට අනුරව අයින් කරන්න පුළුවන්ද?

මොහොතක නායකයන් හලන්න ජවිපෙට පුළුවන. ජවිපෙ සෝමවංශව හැලුවේ එහෙමය. ඒත් එදා සෝමවංශ කියන්නේ නිකම්ම නිකම් පක්ෂ සාමාජිකයෙකි. අද ජවිපෙ නායක අනුර විධායක ජනාධිපතිය. එහෙම බලනකොට ඒ වැඩේ ලේසි නැත. ඒක ජවිපෙ මරාගෙන මැරෙන බෝම්බ කට්ටලයක් බැඳගෙන පැලවත්තට පැන්නා වගේ වැඩකි.

**උපුල් ජෝශප් ප්‍රනාන්දු**

---



### සුළි කුණාටුව ඇවිත් මාස 6යි

# ඒ දුම්බර ගමන නම් මාරයි...

### යනවා නම් මේ තැන් බලන්න අමතක කරන්න එපා...

**දිට්වා සුළි කුණාටු ව්‍යසනයෙන් මාස හයකට පසුව නැවත වරක් හෙමින් හෙමින් අළු ගසා නැඟීසිටින දුම්බර වනපෙතේ සංචාරයක යෙදෙන්න 'කැලෑ කොලමේ' මට අවස්ථාව උදාවුණා. නිසි අරමුණක් හා අවබෝධයකින් සංචාරය කරන්නකුට දුම්බර කියන්නේ පාරිසරික තක්සලාවක්. ක්ෂණිකව වෙනස් වන කාලගුණය, මීදුමෙන් වැසී යන කඳු මුදුන්, අසුරු සැණෙන් කඩාහැලෙන අනෝරා වැසි දුම්බර වනපෙතට අරුමයක් නෙවෙයි. ඒ හැම සංසිද්ධියක්ම මෙකී පරිසර පද්ධතියේ අනේකවිධ අවස්ථාවන් උදාකර දෙනවා.**

'නකල්ස් කඳුවැටිය' එහෙම නැත්නම් දුම්බර වනාන්තරය ලංකාවේ මධ්‍යම පළාතේ මහනුවර හා මාතලේ දිස්ත්‍රික්ක තුළ පිහිටා තිබෙනවා. සිංහලයන් මෙම කඳුවැටිය සාම්ප්‍රදායිකව හඳුන්වනු ලබන්නේ මීදුමෙන් පිරුණු කඳුවැටිය හෙවත් දුමින් බර කඳුවැටිය යන නමින් අරුත් දෙන 'දුම්බර' නමින්. මහනුවර දිස්ත්‍රික්කයේ ඇතැම් ස්ථානවල සිට බලන විට මෙකී කඳුවැටිය මිට මොළවන ලද අතක (නකල්ස්) ආකාරයෙන් පිහිටා ඇති නිසා බ්‍රිතාන්‍ය මිනින්දෝරුවන් මෙය 'නකල්ස් කඳුවැටිය' නමින් හඳුන්වා තිබෙනවා.

දුම්බර කඳුවැටියට මිලිමීටර් 5,080ක පමණ වාර්ෂික වර්ෂාපතනයක් ලැබෙන අතර, නැගෙනහිර බෑවුම්වලට මිලිමීටර් 2,500ත් 4,000ත් අතර වාර්ෂික වර්ෂාපතනයක් ලැබේ. මෙකී වනාන්තර පද්ධතිය තෙත් බිම්, තෙත් නිවර්තන පතන, අර්ධ සදාහරිත නිවර්තන, උපකඳුකර නිවර්තන හා කඳුකර තෙත් හා කඳුකර තෘණ බිම් පතන බිම් වැනි විවිධ පරිසර පද්ධතිවලින් දැක්නට ලැබෙනවා. ඉන් ඔබ්බට විමසුම් ඇස යොමුකිරීමේදී වර්ණවත් තුරුලතා, ගිරිශිඛර, ප්‍රපාත හා තැනිතලා බිම්ද විවිධ භූ ලක්ෂණද දිවයිනේ කිසිදු තැනක දකින්නට නොලැබෙන ඉතා මනස්කාන්ත භූ දර්ශනද ලංකාවට ආවේණික සත්ව හා ශාක විශේෂ ගණනාවක්ද මෙම දුම්බර කඳුවැටිය හා වනාන්තරය තුළ දක්නට පුළුවන්.

අපගේ චාරිකාවේ ගමන් සගයා වූයේ චන්දිම මල්ලි. ඔහු ප්‍රදේශයේ අස්සක් මුල්ලක් නෑර ඇසූපිරූ තැන් ඇත්තෙකු විය. අනෙක් විශේෂිත දැනුම ඇත්තා වූයේ වෘත්තියෙන් නැචුරලිස්ට් කෙනකු වන විකුම් මල්ලි. දුම්බරට ආවේණික සතුන් හඳුනා ගැනීමට ඔහුගේ සහාය මහත් උපකාරයක් විය. දුම්බරට පමණක් ආවේණික දුම්බර පඳුරු මැඩියා, නකල්ස් පඳුරු මැඩියා, පෙති අං කටුස්සා, දුම්බර කුරු බෝදිලිමා, නකල්ස් දිවාසැරි හූනා, පෙතියාගොඩගේ නොසිලූ කටුස්සා ජීවමානව දැකගැනීමේ අවස්ථාව අපට උදාවිය. මේ සියලු සතුන් දැඩි පාරිසරික තර්ජනයන්ට ලක්ව ඇති බව කිව යුතුමය. සමනල වර්ග කීපයක්ද කුරුලු විශේෂ කීපයක්ද අපේ කැමරා කාචවල සටහන් විය."

සංචාරකයන් ගැන සඳහන් කිරීමේදී අප දුටු කාරණයක් වූයේ බොහොමයක් දේශීය සංචාරකයන් දුම්බරට සහ රිවස්ටන්වලට පැමිණෙන්නේ එතරම් අවබෝධයකින් නොවන බවයි. එන්නම් වාලේ පැමිණ මිහිදුමේ පහස පමණක් විඳ නැවත යන්නේ කිසිම අවබෝධයකින් තොරව බව අපි දුටු වාර අනන්තයි.

රාත්‍රියේදී දුම්බර වනපෙත ගෙන එන්නේ අමුතුම ගුප්ත චමත්කාරයක්. එහි තිබෙන ගුප්ත බව හා ත්‍රාසය වචනයෙන් විස්තර කළ නොහැකියි. අප නවාතැන් ගත් ලොජ් එක දුම්බර පරිසරයට ආවේණිකම එකක් විය. එය 100%ක්ම ස්වභාවික විය. ලන්තෑරුම් එළියකින් හා සුන්දර වටපිටාවකින් හෙබි එය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම 'ඉකෝ ෆ්‍රෙන්ඩ්ලි' නවාතැනක් විය.

රාත්‍රියේදී අපිට ගැටහොඹු කටුස්සා, පොළොන් තෙලිස්සා, ඇහැටුල්ලා හා උණහපුළුවා දැකගැනීමට හැකි විය. අපේ අනෙක් ගමන් සගයන් වූයේ අචිනි නංගී, චතු නංගී හා කනිෂ්කය. අපේ සියලු කැමරා ආම්පන්නවල හා අනෙකුත් සියලු උපකරණවල හිමිකරුවා වූයේ කනිෂ්කය.

හිමිදිරියේ ඉර උදාවන දසුන මම මේ රටේ වෙනත් ස්ථානවලින් දැක නැති ඉතා මනරම් දර්ශනයක් විය. එක් පසකින් මොරගහකන්ද ජලාශයද අනෙක් පසින් කළුගඟ ජලාශයද මැදිකොට හිරු උදාව සිත්ගන්නා සුලු වේ. ඇඟ හිරුගඩු පිපෙන සීතලේ අප සියලු දෙනාම මෙකී ආශ්වාදය නොඅඩුව වින්දෙමු.

පිටවල පතන හා කුඩා ලෝකාන්තය දුම්බර ඇති තවත් සුන්දර ඉසව්වකි. කුඩා ලෝකාන්තයේ දකුණු ඉසව්වේ දිට්වා ව්‍යසනයේ නටබුන් තවමත් ශේෂ වී ඇත. ඈතින් පෙනෙන රෙඩ්බානා ගමේ සුන්දර දසුන්ද ඉතා සිත්ගන්නා සුලුය.

නකල්ස් කඳු පන්තියෙන් පටන් ගන්නා තෙල්ගමු ඔයේ ජල පහස විඳගන්නා සංචාරකයකු නැවත වතාවක් එම ප්‍රදේශයට යෑම අනිවාර්යයි. ඒ තරමටම පිරිසිදු ජල පෝෂක ප්‍රදේශයකින් පැමිණෙන මෙකී ජල කඳේ පහස විඳගන්න සංචාරකයෙක් ඇත්තටම පින් කරන්න ඕනේ. බොහෝ දුරට තෙල්ගම ඔය ඉතා පිරිසිදු තත්ත්වයෙන් තිබුණත් සමහර සංචාරකයන්ගේ නොමනා ක්‍රියාකාරකම් නිසා අපවිත්‍ර වී ඇති තැන්ද නැතිවා නොවෙයි. මන්දයත් තෙල්ගමු ඔයේ දුම්බරට හා මෙරටට පමණක් ආවේණික මිරිදිය මත්ස්‍ය වර්ග විශාල ප්‍රමාණයක් රැඳී සිටින ජෛව විවිධත්වයෙන් අනූන ප්‍රදේශයක් නිසා වගකිවයුතු සංචාරකයන් වන අප එය පරිහරණය කිරීමේදී ඉතාමත් ප්‍රවේශම් විය යුතු බවද සඳහන් කරන්නම ඕනේ.

සොබාදහමේ වෙනස්කම් අත්විඳි දින තුනක සංචාරක කෙටි සටහන මෙසේ අවසන් කරන අතර, මෙරට සංචාරකයන්ගෙන් 'කැලෑ කොලමේ' අප ඉල්ලා සිටින්නේ ඔබ පරිසරය විඳින්න කැමැති කෙනෙක් නම් දුම්බර වනපෙතේ රිවස්ටන් කඳු මුදුනේ පහස විඳින්න යන්න. පා සටහන් පමණක් තබා එන්න. ඡායාරූප පමණක් රැගෙන එන්න. මන්ද, දුම්බර ලෝක උරුම වනාන්තරය අනාගත පරපුරටත් උරුම කර රැක බලාගැනීමට ආරක්ෂා කිරීම වර්තමානයේ අපේ පරම යුතුකම වන නිසාය.






---




## වෑගෙදරගම විදුහලට විශිෂ්ට ජයක්

මහව අධ්‍යාපන කලාපයේ අතිදුෂ්කර පාසල් වන වෑගෙදරගම විද්‍යාලයේ සිසු සිසුවියන් මහව කොට්ඨාස තරගාවලියෙන් විශිෂ්ට ජයග්‍රහණ රැසක් ලබාගනිමින් මහව විජයබා විදුහලේ පැවැත්වූ තරග ඉසව් ඉතා සාර්ථකව අවසන් කරන ලදී.

**චානක විජයකුමාර**



# ඔයාගෙ ආදර කතාවයි මගේ ආදර කතාවයි දෙකම එකට කියැවෙන නටත් අයෙක් සූරා මතින්



**මම සාමාන්‍යයෙන් බලන්නේ රූපවාහිනියේ හෝ ස්වාධීන රූපවාහිනියෙහි විකාශය වන නාට්‍යය පමණය. 1982 සිටම ඒවායේ බොහෝවිට ගුණාත්මක, පවුලටම එකට නැරඹිය හැකි, රසවිඳිය හැකි, විශිෂ්ට ගණයේ නිර්මාණයන්ම විකාශය වූ බැවිනි.**

එහෙත් මේ දිනවල මුහුණු පොතේ සංසරණය වන, ස්වර්ණවාහිනියේ විකාශය වන රොෂාන් රවීන්ද්‍ර හෙවත් 'නටත් අයෙක් සූරා මතින්' ටෙලිය පසුගිය දිනෙක බැලුවෙමි. මුල් කොටස් නොබැලුවත් වත්මන් පවුල් සංස්ථාවේ සංසිද්ධි කියාපාන නාට්‍යයක් බැවින් ඉදිරියටත් බැලිය හැකිය. රොෂාන් හෙවත් ලද්දුවාගේ අධ්‍යක්ෂණය කෙසේ වෙතත් රංගනය ඉතා ඉහළය. තාක්ෂණික පැත්තෙන් නාට්‍ය බලන්නේ ටෙලිවිෂන් කලාව දන්නා බොහොම ස්වල්ප දෙනකු වුණාට සමස්තමය ආදරය කරන්නේ කතාවට සහ රඟපෑමටය. රොෂාන් මොකේ රඟපෑවත් එය සාර්ථක වන බව කියාපෑමට ඔහු කලින් රඟපෑ, නාට්‍ය හතළිහක පමණ ප්‍රමාණයෙන් අමුතු මිනිස්සු, ගොවි තාත්තා, රස්තියාදුකාරයා, සහෝදරයෝ, සිටුවර පුවත, සූර සරදියල් වැනි නිර්මාණ ඊට සාක්ෂි දරනවා ඇත.

ලද්දුගේ චරිතයට ප්‍රේක්ෂකයන් මේ තරම්ම ආදරය කරන්නේ අවුරුදු 40, 45 පැනපු බොහෝ දෙනකු තම ප්‍රථම ප්‍රේමයෙන් අත්දැකීම් විඳ නාට්‍ය නරඹන විට හදවත තුළ පැලපදියම් වූ ඒ අතීත ආදර සැමරුම් මතකයට නැගෙන නිසාය. අපි කවුරුත් ඒ ආදරයට තාමත් ආදරේය.

බොහෝ අයගේ ප්‍රථම ප්‍රේමය ලද්දුගේ මෙන් බැංකු නිලධාරිනියක් නොවුණාට කුමක් හෝ වෘත්තියක නියැළෙන්නියක් විය හැකිය. බොහෝ දෙනකුට ප්‍රථම ප්‍රේමය අල්ලලා නොගියාට දෙවැනි, තෙවැනි, හෝ හතර පහද ලද්දුගේ මෙන් සිත පතුලට කාවැදී තිබෙන්නට පුළුවන. ඒ සිතුවිලි ඔළුවේ තියන්, හදවතින්ම ඒ සැමරුම් රසවිඳිමින් ලද්දු දිහා බලද්දී හොර රහසේම කඳුළු වැගිරෙන්නටද පුළුවන. ඒවා බොහෝවිට සතුටු කඳුළු විය හැකිය.

මා මේ නාට්‍යය නැරඹුවේ බිරින්දෑ සමගය. නාට්‍යයේ සාරාංශයද ඇයට පැහැදිලි කරදුන්නේය. මන්ද, ලද්දුගේ චරිතය එකල මටද ටිකක් හෝ ගැළපෙන නිසාය. මාගේ ප්‍රථම ප්‍රේමය නොවුණද එකල පෙම්වතියගේ ප්‍රථම ප්‍රේමය මාය. බැංකුවක ඉහළම නිලධාරිනියකි. විධායක නිලධාරීන්ට එකල ලැබෙන රුපියල් ලක්ෂ දොළහේ ලෝන් එක ගන්න මම යන්නේද එම බැංකුවටය. ඒ වෙනකොට රාජ්‍ය විරෝධීන් ලෙස හංවඩු ගසා රූපවාහිනියෙන් දොට්ට දැමූ දහතුන් දෙනාගෙන් මාද එකෙක්විය. එනිසා මගේ රස්සාව අහිමිවීම සහ ලෝන් ගැනීමද ලද්දුට සමානය. ලෝන් එක ගන්නට ගොස් ඇයව මට මුණගැහෙන්නේ අහම්බෙනි. ඒ වසර 23කට පසුවය. කතාව දිගය. මේ ඇතිය. අපි එදා ලද්දු මෙන් දැත් නොඇල්ලුවෙමි. හැබැයි අදටත් හොඳ මිතුරන්ය.

ලද්දුගේ හොඳම හරිය ආරම්භ විය හැක්කේ ඊයේ අල්ලපු අතත් එක්කය. ලබන සතියේ සිට කතාවේ ගිනි බෝම්බද පිපිරෙන්නට හැකිය. අද ලද්දුට ආදරය කරන්නෝ, එදාට විශේෂයෙන්ම කාන්තා පාර්ශ්වය ලද්දුටත්, ශානිකාටත් වෛර කර බිරිඳ නන්දිට අනුකම්පා ප්‍රේමය පිරිනමන්නටත් පුළුවන. ඒ, අත් පටලැවිල්ල කොහෙන් කෙළවර වේදැයි කියන්නට තාම බැරිය. අද සමාජයේ බොහෝ නිවෙස්වල පවුල් අවුල්වලට මූලික වන මේ යථාර්ථය ඉස්සරහට මේ පවුලටත් හෙණයක් වෙන්නටද පුළුවන.

එදා සිටම හොඳ යැයි සම්මත නාට්‍ය විකාශය වුණේ රූපවාහිනියේ සහ අයි.ටී.එන්. එකේය. මේ දෙකට නාට්‍ය තේරීමට දහ පහළොවකින් සමන්විත මණ්ඩලයක්ද ඇත. එහෙම තිබ්බාට ඒවායින් කතින් රිංගා විකාශය වූ දෙකේ කොළේ නාට්‍ය ඕනේ තරම් ඇත. කෙහෙළිය ඇමැති කල නාට්‍ය සඳහා කප් ගැසූ අයෙකි. මේ මණ්ඩලවලට පත්වන්නේද බොහෝවිට ඇමැතිගේ හෝ ආණ්ඩුවේ හිතවතුන්ය. ඒක එදාද අදද කියලා වෙනසක් නැත. මේ නාට්‍යයත් යන්න තිබුණේ අයි.ටී.එන්. එකටලු. ඒකට දාලා ඉන්න ලොක්කත්, නාට්‍ය මණ්ඩලයේ සාමාජිකයන්ද ආණ්ඩුවේම වෙනකොට එහෙම හැලෙන්නේ කොහොමද කියලා ලියලා තිබුණේ මගේ පාසල් මිත්‍ර මාධ්‍ය සගයා උවිඳු කුරුකුලසූරියගේ මුහුණු පොතේය. නාට්‍යයක් තෝරන්නේ නම් එම විෂයත්, ටෙලිවිෂණය පිළිබඳ විෂයානුබද්ධව ප්‍රගුණ කළ ඇත්තන් විය යුතුය. කැමරා කෝණ, ආලෝකකරණය, පසුතලය, ශබ්ද පරිපාලනය, වේශ නිරූපණය, ඇඳුම් පැලඳුම්, පිළිබඳ දන්නේ නැති අයට පමණක් නාට්‍ය තෝරන්න බැරිය. විශේෂයෙන්ම ජාතික රූපවාහිනියටත් අයි.ටී.එන්. එකටත් ඒක අදාළය. එදා සිටම හැම නාට්‍යයකින්ම සම්මාන පිට සම්මාන ලැබුණේ ජාතික රූපවාහිනියෙන්ම නිෂ්පාදනය වූ නාට්‍යය සඳහාය. ඒ සඳහා වෙනම අංශයක්ද තිබූ එකල, එකම නාලිකාව රූපවාහිනිය විය. ධම්ම ජාගොඩ, පරාක්‍රම නිරිඇල්ල, ලූෂන් බුලත්සිංහල, බන්දුල විතානගේ, බර්ට්‍රම් නිහාල්, තිලක් ගුණවර්ධන, යූ. ආරියවිමල්, විමලරත්න අධිකාරී, දයාරත්න රටගෙදර, අනුර ජයසේකර, සුදත් දේවප්‍රිය, පමණක් නොව, සුසිරන් ද සිල්වා, සමන් කුමාර ලියනගේ, සන්තුස ලියනගේ, මොහාන් ජී. රංගනාථ, ගයා රම්‍ය අල්විස් වැන්නන්ද අග්‍රගණ්‍ය නාට්‍ය රටට පිරිනැමූ ශිල්පීන්ය. දැන් වසර ගණනාවක් පුරාම ඒ අංශය මිලිනව ගොස්ය. පිටින් ගන්නා නාට්‍ය පෙන්නා සම්මාන ගන්නවාට වඩා තමන්ගේම නිෂ්පාදකවරුන්ගෙන් නාට්‍යයක් නිර්මාණය කරගැනීමට රූපවාහිනියට තාමත් කාලය ඇත.

ඉතින් අපි සූරා මතින් නොව, හදවතින් රොෂාන්ව බලමු.

*ෂර්ලි අනිල් ද සිල්වා*





# GOLDSMITHS" UNIVERSITY OF LONDON" BCAS CAMPUS සමග අත්වැල් බැඳගනී

එක්සත් රාජධානියේ වඩාත්ම ගෞරවනීය විශ්වවිද්‍යාලවලින් එකක් වන Goldsmiths, University of London ගෝලීය මට්ටමේ බ්‍රිතාන්‍ය උපාධි පාඨමාලා පෙළක් ශ්‍රී ලංකාවට හඳුන්වා දීම සඳහා BCAS Campus සමග හවුල්කාරීත්වයකට එළඹ ඇත.

ලන්ඩන් විශිෂ්ටතම විශ්වවිද්‍යාල 10 අතරට ශ්‍රේණිගත වී ඇති (Complete University Guide 2027) සහ මේ වසරේදී සිය 120 වැනි සංවත්සරය සමරන Goldsmiths University, ලන්ඩන් විශ්වවිද්‍යාලයට (University of London) අයත් ප්‍රමුඛතම විශ්වවිද්‍යාලයකි. එමගින්, ලොව සීමිත විශ්වවිද්‍යාල කිහිපයකට පමණක් හිමිවන සුවිශේෂ ජාත්‍යන්තර පිළිගැනීමක් ඊට හිමිකර දී ඇත. මෙම අනුබද්ධතාවය හරහා ශ්‍රී ලාංකේය සිසුන්ට පරිගණක විද්‍යාව (Computer Science), ව්‍යාපාර කළමනාකරණය (Business Management), මනෝවිද්‍යාව (Psychology) සහ නීතිය (Law) යන ක්ෂේත්‍රයන්ගෙන් ගෝලීය වශයෙන් පිළිගත් උපාධි පාඨමාලා, BCAS කැම්පස් හරහා මෙරටේදීම හැදෑරීමේ සෘජු අවස්ථාව උදාවේ.

ආයතන ද්විත්වයේම ජ්‍යෙෂ්ඨ නායකත්වයේ සහභාගිත්වයෙන් යුතුව, මෙම ගිවිසුම 2026 ජූනි මස 03 වැනිදා ලන්ඩන්හි පිහිටි Goldsmiths University පරිශ්‍රයේදී අස්සන් තබන ලදී. මේ සඳහා Goldsmiths University නියෝජනය කරමින් එහි උපකුලපති මහාචාර්ය ඩේවිඩ් ඔස්වෙල් (David Oswell) සහ නියෝජ්‍ය උපකුලපති මහාචාර්ය ඇනබෙල් කියර්නන් (Annabel Kiernan) යන මහත්ම මහත්මීන්ද, BCAS Campus වෙනුවෙන් එහි සභාපති රාජේන්ද්‍ර ත්‍යාගරාජා (Rajendra Theagarajah) මහතා සහ ප්‍රධාන විධායක නිලධාරී ටෙරේෂ් අමරතුංග (Teresh Amaratunga) මහතාද සහභාගි වූහ.

මෙහිදී අදහස් දැක්වූ Goldsmiths ආයතනයේ උපකුලපති මහාචාර්ය ඩේවිඩ් ඔස්වෙල් මහතා මෙසේ පැවැසීය.

'BCAS කැම්පස් සමග මෙම හවුල්කාරීත්වය නිල වශයෙන් ආරම්භ කිරීමට ලැබීම පිළිබඳ අප බෙහෙවින් සතුටට පත්වෙනවා. මෙම ගිවිසුම මගින් අධ්‍යාපනික ගුණාත්මකභාවය, ශිෂ්‍යයන්ගේ සාර්ථකත්වය සහ ගෝලීය අධ්‍යාපනය සඳහා ඇති ප්‍රවේශය පුළුල් කිරීම වෙනුවෙන් අප සතු කැපවීම මැනැවින් පිළිබිඹු කරනවා. ඉදිරි වසරවලදී ශ්‍රී ලංකාවේ සිසුන්ට Goldsmiths උපාධි ලබාගැනීමට අතහිත දීමට සහ ශක්තිමත් මෙන්ම තිරසාර හවුල්කාරීත්වයක් ගොඩනැගීමට අප බලාපොරොත්තු වෙනවා.'


BCAS Campus යනු ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ වසර 27කට අධික පළපුරුද්දක් ඇති, කොළඹ, නුවර, යාපනය සහ කල්මුණේ යන නගරවල සිය ශාඛා පවත්වාගෙන යමින් දිවයින පුරා සිටින සිසුන්ට ජාත්‍යන්තරව අනුබද්ධිත උපාධි පිරිනැමීමේ දිගුකාලීන ඉතිහාසයක් ඇති ආයතනයකි.

මෙම නව හවුල්කාරීත්වය පිළිබඳ අදහස් දක්වමින් BCAS කැම්පස්හි ප්‍රධාන විධායක නිලධාරී ටෙරේෂ් අමරතුංග මහතා මෙසේ ප්‍රකාශ කළේය.

'මෙය BCAS කැම්පස්හි සැමට මෙන්ම, මවුබිමෙන් බැහැර නොවී ගෝලීය මට්ටමේ බ්‍රිතාන්‍ය අධ්‍යාපන සුදුසුකමක් ලබාගැනීමට නිරන්තරයෙන් සිහින මැවූ ශ්‍රී ලාංකේය සිසුන්ට ඉතා ආඩම්බරකාරී මොහොතක්. මෙම පාඨමාලා පෙළ හඳුන්වාදීම තුළින් ශ්‍රී ලාංකේය සිසුන්ට ගෝලීය තලයේ තමන්ගේම සලකුණක් තැබීමට මනා පිටිවහලක් ලැබෙනු ඇතැයි අපට විශ්වාසයි....'

2026 සැප්තැම්බර් මාසයේදී ආරම්භ වීමට නියමිත සමාරම්භක කණ්ඩායම (Inaugural batch) සඳහා සිසුන් ලියාපදිංචි කරගැනීම මේ වනවිට සිදුවේ.





රාජ්‍ය රහස්

# ගෝර් අනුරව මගහරියි

## ඇමෙරිකාව එක්ක අලුත් අවුලක්

**අවස්ථා ගණනාවකදීම 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ ඇමෙරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ විශේෂ නියෝජිතයා වූ දකුණු සහ මධ්‍යම ආසියාව සඳහා වූ ඇමෙරිකා එක්සත් ජනපද විශේෂ නියෝජිත සර්ජියෝ ගෝර් සම්බන්ධයෙන් සුවිශේෂ තොරතුරු කිහිපයක් අප මෙම තීරයේ වාර්තා කර තැබුවෙමු.**

මුලින්ම අප ගෝර් පිළිබඳ වාර්තා කළේ ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය ආමන්ත්‍රණය කිරීම සඳහා ඇමෙරිකාවේ නිව්යෝර්ක් නුවරට ගිය අවස්ථාවේදී ගෝර් හමුවීම පිළිබඳවය. එහිදී ට්‍රම්ප්ගේ විශේෂ නියෝජිතයා වශයෙන් ගෝර් ජනාධිපති අනුර සමග විශේෂ සාකච්ඡාවක් පැවැත්වූ අතර, එම සාකච්ඡාවේදී ඕනෑම අවස්ථාවකදී ට්‍රම්ප් ජනාධිපතිවරයාව සම්බන්ධ කර දීමේ හැකියාව තමන්ට ඇති බව ගෝර් විසින් ජනාධිපතිවරයාට දැනුම් දුන් බවද අපි එහිදී සඳහන් කළෙමු.

ඉන් අනතුරුව ගෝර් සම්බන්ධයෙන් අප තොරතුරු අනාවරණ කළේ ඔහුගේ හදිසි ලංකා සංචාරය පිළිබඳවත්, එම සංචාරයේදී ගෝර් මුලින්ම ජනාධිපති කාර්යාලයේදී ජනාධිපතිවරයා හමුවීමෙන් පසු කෙළින්ම කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තයට සහ බටහිර පර්යන්තයට ගොස් එම ස්ථානවල පිහිටි ක්‍රේන් දොඹකරවලට නැගී සමස්ත වරායත්, ඉන්දියානු සාගරයත් නිරීක්ෂණය කළ බවත් අපි එහිදී සඳහන් කර සිටියෙමු. එම සිදුවීම මෙරට කිසිදු මාධ්‍යයකින් වාර්තා කිරීමට කටයුතු නොකිරීමද විශේෂ සිද්ධියකි. කෙසේ වෙතත් ගෝර් හා ජනාධිපතිවරයා අතර සිදුවූ හමුවේදී ලංකාවට වෙරළාරක්ෂක නෞකාවක් සහ ජීවිතාරක්ෂක හෙලිකොප්ටර් යානා 10ක් ලංකාවට ලබාදීමට ඇමෙරිකාව සූදානම් බවද ගෝර් ජනාධිපතිවරයා වෙත දැනුම්දී සිටියේය. මේ බවද 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ වාර්තා කළ අප, එම නෞකාව සහ හෙලිකොප්ටර් යානා ලංකාවට ලබාදෙන අවස්ථාවේදී ඊට අදාළ උත්සවයට සහභාගි වීමට ගෝර් පෞද්ගලිකවම ලංකාවට පැමිණීමට නියමිත බවද වාර්තා කර සිටියෙමු. මෙය ශ්‍රී ලංකා සහ ඇමෙරිකානු රාජ්‍යතාන්ත්‍රික සබඳතාවන්හි ඉතා සුවිශේෂ අවස්ථාවක් වනු ඇති බවද අප එහිදී සටහන් කොට තැබුවෙමු.

අප කී ආකාරයටම පසුගිය බ්‍රහස්පතින්දා දිනයේදී මෙම වෙරළාරක්ෂක නෞකාව ශ්‍රී ලංකාවට භාරදීමට ඇමෙරිකාව පියවර ගත්තේය. ජනාධිපතිවරයාද සහභාගී වූ මෙම උත්සවය ඉතා ඉහළින් සැමරීමට මෙරට පිහිටි ඇමෙරිකානු තානාපති කාර්යාලය කටයුතු කොට තිබුණද, එහි විශාල අඩුවක් බැලූ බැල්මටම බොහෝ දෙනාට දැකගන්නට ලැබිණි. ඒ අඩුව වෙන මොකක්වත් නොව, ට්‍රම්ප් ජනාධිපතිවරයාගේ විශේෂ නියෝජිතයා වූ සර්ජියෝ ගෝර්ගේ මුහුණ එහිදී දැකගන්නට නොවීමය. එසේ නම් මෙම වෙරළාරක්ෂක නෞකා සහ හෙලිකොප්ටර් යානා ලංකාවට ලබාදීමට මැදිහත් වූ සහ එම උත්සවයට තමන් පැමිණෙන බව කල් තියාම දැනුම්දී තිබියදීත් සර්ජියෝ ගෝර් ඊට සහභාගි නොවූයේ ඇයි? ඔහුගේ නොපැමිණීමට බලපෑ හේතුව කුමක්ද?

මේ සම්බන්ධයෙන් තොරතුරු සොයාගෙන යැමේදී 'රාජ්‍ය රහස්' තීරයට වාර්තා වූයේ ගෝර්ගේ මේ නොපැමිණීම පසුපස විශාල රාජ්‍යතාන්ත්‍රික ප්‍රශ්නයක් මතුව ඇති බවය. ඒ අනුව ඇමෙරිකාව සහ ලංකාව අතර මතුව තිබූ මෙම රාජ්‍යතාන්ත්‍රික ප්‍රශ්නය කිසිදු මාධ්‍යයකින් එළියට පැමිණ නොතිබූ නිසා මෙවර 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ එම ගැටලුව සම්පූර්ණයෙන්ම රටට අනාවරණ කිරීමට අප සූදානම්ය.

අප වෙත ලැබී ඇති තොරතුරුවලට අනුව නම් ගෝර් ලංකාවට නොපැමිණීම පසුපස ඇත්තේ ඇමෙරිකාව සහ ඉරානය අතර පැවැති යුද්ධයට අදාළ සිදුවීමකි. එහිදී ඉරානය විසින් හෝමුස් සමුද්‍ර සන්ධිය සම්පූර්ණයෙන්ම අවහිර කිරීමෙන් පසු එය විවෘත කිරීම සඳහා මීට සති කිහිපයකට ඉහතදී එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයට ඇමෙරිකාව විසින් විශේෂ යෝජනාවක් ඉදිරිපත් කළේය. මෙය ඉතා පහසුවෙන් සම්මත කරගත හැකි වනු ඇති බව මුලදී පෙනී ගියද එය ඉතා අසීරු එකක් බවට පත්වන ලකුණු දැකගන්නට ලැබුණේ චීනය සහ රුසියාව සිය නිශේධ බලය යොදා ඇමෙරිකාව විසින් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයට ගෙන ආ එම යෝජනාව පරාජයට පත්කිරීමත් සමගය. සාමාන්‍යයෙන් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේදී මෙවැනි යෝජනාවක් පරාජයට පත්වූ විට එය නැවත වතාවක් සම්මත කරගැනීමට නම් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය වෙත එම යෝජනාව යළි ඉදිරිපත් කළ යුතුය. එපමණක් නොව එය එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ සාමාජික රටවල් ප්‍රමාණයෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් සම්මත කරගත යුතුය. මතුව තිබූ වාතාවරණය යටතේ හෝමුස් සමුද්‍ර සන්ධිය කෙසේ හෝ විවෘත කරගැනීමේ අවශ්‍යතාව නිසා ඇමෙරිකාව තීන්දු කළේ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයෙන් ප්‍රතික්ෂේප වූ එම යෝජනාව එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය වෙත ඉදිරිපත් කර එය සම්මත කරගැනීමටය. ඒ අනුව ඊට අදාළ යෝජනාව සකස් කළ ඇමෙරිකාව, එය එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය නියෝජනය කරන සියලු රටවල නියෝජිතයන්ට අස්සන යෙදීම සඳහා යැවීමට සැලසුම් කර තිබිණි.

## අත්සන් කරන්න බෑ කියයි

**දකුණු ආසියානු කලාපය ගතහොත් එම යෝජනාව පැමිණි අවස්ථාවේදී මුලින්ම ඊට පක්ෂව අස්සන් තැබුයේ ඉන්දියාවය. ඉන් අනතුරුව බංග්ලාදේශය, නේපාලය වැනි රටවල්ද එම ගිවිසුමට අස්සන් තැබීමට කටයුතු කළේය. නමුත් පාකිස්තානය ඊට අස්සන් තැබීමට කටයුතු කළේ නැත. ඒ සඳහා බලපෑ සාධාරණ හේතුවක් ඔවුන් ඇමෙරිකාවට ඉදිරිපත් කිරීමට කටයුතු කළේය.**

ඒ, දැනට ආරම්භ වී ඇති ඇමෙරිකා - ඉරාන සාම සාකච්ඡාවල මැදිහත්කරුවකු වශයෙන් පාකිස්තානය කටයුතු කරන නිසා මෙවැනි යෝජනාවකට අස්සන් තැබුවහොත් එය මැදිහත්කාර භූමිකාවට අහිතකර ලෙස බලපානු ඇති බැවින් ඊට අස්සන් තැබිය නොහැකි යැයි කියාය. ඔවුන් ඉදිරිපත් කළ එම සාධාරණ හේතුව පිළිගත් ඇමෙරිකාව, පාකිස්තානයට ඊට අස්සන් නොතැබීම සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිචාරයක් දැක්වූයේ නැත.

නමුත් මෙහිදී දැකගන්නට ලැබුණු විශේෂම සිදුවීම වූයේ දකුණු ආසියානු කලාපයේ ප්‍රබලම රටවල් පවා ඊට අස්සන් තබා තිබියදී ලංකාව එම යෝජනාවට අස්සන් කිරීම ප්‍රතික්ෂේප කිරීමය. මුලින් මුලින් එය ප්‍රකාශයට පත් නොකර ලංකා ආණ්ඩුව කල් මරද්දී ශ්‍රී ලංකාවේ ඇමෙරිකානු තානාපති කාර්යාලය සහ එක්සත් ජාතීන්ගේ මෙරට කාර්යාලය මගින් අවස්ථා ගණනාවකදීම මෙම යෝජනාවට අස්සන් තබන ලෙස ආණ්ඩුවට සිහිකැඳවීම් සිදු කොට තිබිණි. නමුත් ඊටද ප්‍රතිචාර නොදක්වමින් ලංකාව නිහඬව සිටීම නිසා අවසානයේ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ලිඛිතවම එහි ඇති බැරෑරුම්කම සඳහන් කරමින් ආණ්ඩුවට සහ විදේශ අමාත්‍යාංශයට ලිපියක් යොමුකොට තිබූ බවක්ද 'රාජ්‍ය රහස්' තීරයට ආරංචිය.

ඒ අනුව, අවසානයේදී නිහඬව සිටිය නොහැකි තැනට මෙම අර්බුදය තල්ලු වූ විට ලංකාව පැත්තෙන් දැනුම් දී තිබුණේ මෙම ලිපියට අස්සන් තැබීමට නොහැකි බවය. ඊට හේතුව මෙම යෝජනාව ඉරානය නොමැතිව ඒකපාර්ශ්විකව ඉදිරිපත් කොට ඇති බවය.

ලංකාවේ මෙම ස්ථාවරය දැනුම් දුන් වහා ට්‍රම්ප් පරිපාලනය ලංකාව සම්බන්ධයෙන් බොහෝ විමතියට සහ බලාපොරොත්තු කඩවූ තත්ත්වයකට පත්වූ බවක් 'රාජ්‍ය රහස්' තීරයට ආරංචිය. ඒ අනුව, ඇමෙරිකාව ලංකාවට ලබාදුන් පළමු රාජ්‍යතාන්ත්‍රික සංඥාව වී තිබුණේ ඇමෙරිකාව මගින් ලංකාවට ලබාදුන් වෙරළාරක්ෂක නෞකාව භාරගැනීමේ උත්සවයට සර්ජියෝ ගෝර් සහභාගි නොකිරීමය. ඒ අනුව මේ වනවිට තානාපති ක්ෂේත්‍රයේ විශාල වශයෙන් කතාබහට ලක්වන කාරණාවක් වන්නේ මෙම පසුබිම යටතේ ලංකාවට ඉදිරියේදී බරපතළ ප්‍රශ්න ගණනාවකට මුහුණ දීමට සිදුවනු ඇතැයි කියාය.

එය ඇස්පනාපිට තහවුරු වීමට වැඩි කාලයක් ගතවූයේ නැත. ඇමෙරිකාව ශ්‍රී ලංකාව ඉලක්ක කරගෙන තවත් 12.5%ක අමතර තීරුබද්දක් පැනවීමට පසුගිය සතියේ යෝජනා කිරීමට පියවර ගත්තේ මෙම පසුබිම යටතේය. එහිදී ඇමෙරිකාව ඉදිරිපත් කළ යෝජනාවේ සඳහන්ව තිබුණේ ශ්‍රී ලංකාව ඇතුළු රටවල් 60කට බලහත්කාර ශ්‍රමය භාවිතයෙන් නිෂ්පාදිත භාණ්ඩ ආනයනය වළක්වා ගැනීම සඳහා අතිරේක තීරුබදු පැනවීමට යෝජනා කර ඇති බවකි. ඇමෙරිකානු වෙළෙඳ නියෝජිත කාර්යාලය (යූ.එස්.ටී.ආර්.) විසින් කරන ලද දීර්ඝ විමර්ශනයකින් පසු මෙම යෝජනාව ඉදිරිපත් කොට තිබූ අතර, බලහත්කාර ශ්‍රමයෙන් නිෂ්පාදිත භාණ්ඩ ලෝක වෙළෙඳපළට පැමිණීම වැළැක්වීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගත් බවට මෙහිදී ඇමෙරිකාව විසින් රටවල් 60කට චෝදනා එල්ල කොට තිබිණි. ඒ අනුව කැනඩාව, යුරෝපා සංගමය, මෙක්සිකෝව, පාකිස්තානය, බංග්ලාදේශය, මැලේසියාව, තායිවානය, බ්‍රිතාන්‍යය ඇතුළු රටවල් කිහිපයකට 10%ක අතිරේක තීරුබද්දක් යෝජනා කර ඇති අතර, ශ්‍රී ලංකාව ඇතුළු අනෙක් රටවල් 45කට 12.5%ක අතිරේක තීරුබද්දක් පැනවීමට ඇමෙරිකාව යෝජනා කොට තිබේ.

සාමාන්‍යයෙන් ලංකාවේ බොහෝ කර්මාන්ත සිය නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍ය ආනයනය කරනු ලබන්නේ චීනය සහ රුසියාව වැනි රටවලිනි. ඒ අනුව මෙම චීන සහ රුසියානු අමුද්‍රව්‍ය යොදාගෙන විශාල වශයෙන් ඇඟලුම් නිෂ්පාදනය කිරීම ශ්‍රී ලංකාව විසින් සිදුකරනු ලබයි. ලංකාවේ විශාලතම අපනයන වෙළෙඳපොළ ඇමෙරිකාව වන බැවින් එරට රජය මගින් පැනවීමට යෝජනා කොට ඇති මෙම 12.5%ක අතිරේක තීරුබද්දත් සමග ලංකාවේ ඇඟලුම් අපනයන කර්මාන්තයට විශාල බලපෑමක් සිදුවීම වැළැක්විය නොහැකිය. එහිදී ඇමෙරිකානු ගැනුම්කරුවන්ට ශ්‍රී ලංකාවේ භාණ්ඩවලට වැඩි මිලක් ගෙවීමට සිදුවන අතර, ඒ හරහා ලංකාවේ අපනයන ආදායමට සහ රැකියා ක්ෂේත්‍රයට විශාල බලපෑමක් සිදුවීම වැළැක්විය නොහැක. ඇමෙරිකාව මෙසේ 12.5%ක අමතර තීරුබද්දක් ලංකාවට පැනවීමට යෝජනා කොට ඇත්තේ මේ වනවිටත් 20%ක තීරුබද්දක් ලංකාවේ භාණ්ඩ මත පනවා තිබියදී වීම විශේෂත්වයකි.

## මහින්දත් නැතිව මොනවා වෙයිද?

**පසුගිය කාලවකවානුවේදී මෙම ඇමෙරිකානු තීරුබදු ප්‍රශ්නයට ලංකාවට මුහුණ දීමට සිදුවූ විට එය සැනසුම් සුසුමක් හෙළිය හැකි මට්ටමට අඩුකර ගැනීමට විශාල සටනක් ගෙන ගියේ වෙන කවුරුවත් නොව ඇමෙරිකාවේ ශ්‍රී ලංකා තානාපතිවරයා වශයෙන් කටයුතු කළ මහින්ද සමරසිංහ මහතාය.**

ට්‍රම්ප් විසින් මුල් අවස්ථාවේ ලංකාවට 44%ක තීරුබද්දක් යෝජනා කළද, පසුව මහින්ද සමරසිංහ වොෂින්ටනය සමග සාකච්ඡා කොට එම තීරුබදු ප්‍රමාණය 20% දක්වා පහළ දමාගැනීමට කටයුතු කොට තිබිණි. 2019 මහ මැතිවරණයෙන් පසු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් කටයුතු කළ මහින්ද සමරසිංහ එම මන්ත්‍රී ධුරයෙන් ඉවත් වී ඇමෙරිකානු තානාපති ධුරය භාරගැනීමට තීන්දු කළේ එවක ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ඉල්ලීමකට අනුවය. ඒ අනුව ගෝඨාගේ පාලන සමයේදී පැමිණි කොවිඩ් අර්බුදයෙන් සහ ඉන් අනතුරුව මතුවූ ආර්ථික අර්බුදයෙන් රට බේරාගැනීම සඳහා ඇමෙරිකානු තානාපතිවරයා වශයෙන් මහින්ද සමරසිංහ අමෙරිකාවේ සිට විශාල කාර්යභාරයක් සිදුකළේය. එහි ප්‍රතිඵලය වූයේ ගෝඨා බලයෙන් පහ කිරීමෙන් පසු පාර්ලිමේන්තුව හරහා ජනාධිපති ධුරයට පත් රනිල් වික්‍රමසිංහ මහතාද මහින්ද සමරසිංහව තවදුරටත් ඇමෙරිකානු තානාපතිවරයා වශයෙන් එම ධුරයේ තබාගැනීමය. රනිල්ගෙන් පසු බලයට පත්වූ අනුර කුමාර දිසානායක මහතා පවා අතිමහත් බහුතරයක් වූ තානාපතිවරුන් ලංකාවට කැඳවීමට කටයුතු කළද, මහින්ද සමරසිංහ මහතා තවදුරටත් එම තනතුරේ තැබීමට තීරණය කළේ ඔහු විසින් සිදුකළ රාජ්‍යතාන්ත්‍රික කටයුතුවල සාර්ථකභාවය මුල් කරගෙනය. ඇතැම් අවස්ථාවලදී ආණ්ඩුවේ ප්‍රබල ඇමැතිවරයකු වූ වසන්ත සමරසිංහ පවා මහින්ද සමරසිංහ සිදුකළ මෙහෙය අවඥාවෙන් යුතුව හෑල්ලුවට ලක්කරද්දී ජනාධිපතිවරයා පෞද්ගලිකවම පාර්ලිමේන්තුවට පැමිණ මහින්ද සමරසිංහව ආරක්ෂා කිරීමට කටයුතු කළේ ඔහු ඉතා දක්ෂ අයුරින් සිය රාජකාරිය සිදුකොට තිබීම නිසාය. එමෙන්ම ලංකාවට එරෙහිව බටහිර රටවල් විසින් ජිනීවා මානව හිමිකම් කොමිසමට ලංකාව සම්බන්ධයෙන් යුද අපරාධ චෝදනාව මුල් කරගෙන යෝජනාවක් ඉදිරිපත් කළ අවස්ථාවේදී ලංකා ඉතිහාසයේ පළමු වතාවට ඡන්දයක් මගින් එම යෝජනාව පරාජයට පත්කිරීමට මූලිකත්වය ගත්තේද එවක විදේශ අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ මහින්ද සමරසිංහය. නමුත් දැන් ඇති ප්‍රශ්නය වී ඇත්තේ මහින්ද සමරසිංහ ඇමෙරිකානු තානාපති ධුරයෙන් ඉවත් වන බවට වූ ලිපිය දැනටමත් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීමය. එම ලිපියේ සටහන්ව ඇත්තේ ජූලි 31 වනවිට තමන් ඇමෙරිකානු තානාපති ධුරයෙන් ඉවත්ව ලංකාවට පැමිණෙන බවය. ඒ අනුව දැන් මතුව ඇති ප්‍රශ්නය වී ඇත්තේ මහින්ද සමරසිංහ ඇමෙරිකානු තානාපති ධුරයෙන් ඉවත් වීමෙන් පසු මෙවැනි අර්බුද විසඳා ගැනීමට ලංකා ආණ්ඩුව කටයුතු කරන්නේ කෙසේදැයි කියාය. මහින්ද සමරසිංහ වෙනුවට එම තනතුරට පත්කරන්නේ කවුරුන්දැයි කියාය.

## අන්තිමට ගහපු ගේම

**අවසන් වතාවට ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් ලංකාව ඉලක්ක කරගෙන 44%ක තීරුබද්දක් පැනවීමට කටයුතු කරද්දී එය 20% දක්වා අඩුකර ගැනීමට කටයුතු කළේ වෙන කවුරුවත් නොව මහින්ද සමරසිංහය.**

එහිදී වාචිකව එම එකඟතාවන්ට එළඹුණද එය ගිවිසුමක් දක්වා ගෙනයන තැනට වූ කටයුතු පසුගිය කාලයේදී අවසන්ව තිබුණේ නැත. විශේෂයෙන්ම බංග්ලාදේශය ජන අරගලයකින් පසු හිටපු අගමැතිවරිය රටින් පන්නා දැමීමේ පසුබිමක පවා බංග්ලාදේශ ආණ්ඩුව ඇමෙරිකානු රජය සමග සාකච්ඡා කොට එරටට පැනවූ 20%ක තීරුබද්ද ගිවිසුමක් දක්වා රැගෙන යාමට කටයුතු කොට තිබිණි. නමුත් ලංකාව ඇමෙරිකාව විසින් පනවා තිබූ ඇතැම් කොන්දේසිවලට එකඟ නොවීම මත එම සාකච්ඡා දිගින් දිගටම ඇදෙමින් පැවැති ආකාරයක් දැකගන්නට ලැබිණි. කෙසේ වෙතත් මහින්ද සමරසිංහ රට වෙනුවෙන් අවසන් වරට කළ මෙහෙයුම වී තිබුණේ එම 20%ක තීරුබදු පැනවීම පිළිබඳ සාකච්ඡා සාර්ථකව අවසන් කොට එය ගිවිසුමක් දක්වා ගෙනයෑමට කටයුතු කිරීමය. ඒ අනුව පසුගිය සතිය වනවිට මහින්ද වොෂින්ටනය සමග සාකච්ඡා කොට එම ගිවිසුම්වලට අස්සන් තැබීමට දින වකවානු පවා වෙන්කර ගැනීමට සමත්ව සිටියේය. ඒ අනුව ලබන ජූලි 20 වැනි දිනට ප්‍රථම ඊට අස්සන් තැබීමට හැකිවනු ඇති බව 'රාජ්‍ය රහස්' තීරයට ආරංචිය.

නමුත් මහින්ද සිය තනතුරෙන් ඉල්ලා අස්වී ලංකාවට පැමිණි පසු තත්ත්වය කුමක් වනු ඇද්ද? ඇමෙරිකාව විසින් ලංකාවට එරෙහිව යෝජනා කොට ඇති 12.5%ක නව තීරුබද්ද සම්බන්ධයෙන් ඇමෙරිකානු රජය සමග සාකච්ඡා ආරම්භ කරන්නේ කවුරුන්ද? මහින්ද කළාක් මෙන් එම තීරුබදු ප්‍රතිශතයද අඩුකර ගැනීමට අලුත් තානාපතිවරයාට හැකියාව ලැබෙයිද? එසේ නොවුණහොත් ලංකාවට බරපතළ අපනයන අර්බුදයකට මුහුණ දීමට සිදුවනු ඇති බව අමුතුවෙන් කිවයුතු නැත. බොහෝ ආර්ථික විශ්ලේෂකයන් ලංකාවේ නැවත ආර්ථික අර්බුදයක් ඇතිවිය හැකි බවට අනතුරු අඟවා ඇති පසුබිමක කොරේ පිටට මරේ කියන්නාක් මෙන් ට්‍රම්ප්ගේ මෙම නව බද්දද ලංකාවේ කර මතට වැටුණහොත් ලංකාවේ අනාගතය කුමන අතකට පෙරළෙනු ඇත්දැයි දැන්ම තියා කිව නොහැකිය.

## ඉරාන්ට දොර වැහෙයි

**පසුගිය සතියේ අප 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ තවත් සුවිශේෂ තොරතුරක් අනාවරණ කරමින් ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිල නියෝජිතයන් සහ ජනාධිපතිවරයා අතර සිදුවූ හමුවේ අතිශය රහසිගත තොරතුරු විශාල ප්‍රමාණයක් අනාවරණ කිරීමට පියවර ගත්තෙමු.**

එහිදී අප කියා සිටියේ ලංකා ආණ්ඩුව ඉරාන් වික්‍රමරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් අතුරු පාලක කමිටුවක් පත්කොට එය වසරක කාලයක් සඳහා රැගෙන යැමට සැලසුම් කර ඇති නමුත් බොහෝ දුරට ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය මගින් එම කාලය මාස 3කට සීමා කිරීමට කටයුතු කරනු ඇති බවකි. ඊට උදාහරණයක් ගෙනහැර දක්වමින් අප කියා සිටියේ බංග්ලාදේශයේද මේ ආකාරයට ක්‍රිකට් පරිපාලනය විසුරුවා හැර අතුරු කමිටුවක් පත්කිරීමට කටයුතු කළ අවස්ථාවේදී ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය ඔවුන්ටද මාස 3ක් ඇතුළත නිලවරණය පවත්වා අවසන් කළ යුතු බව දැනුම් දී තිබූ බවකි.

එමෙන්ම ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ ඉහළ නිලධාරීන් දෙදෙනකු ලංකාවට පැමිණ පැලවත්ත ජවිපෙ පක්ෂ මූලස්ථානයේදී ජනාධිපතිවරයා හමුවූ ආකාරයත්, එහි පැවැති සාකච්ඡාව තරමක උණුසුම් මුහුණුවරක් ගත් ආකාරයත් අප එහිදී අනාවරණ කර සිටියෙමු. මෙම නිලධාරීන් දෙදෙනා ලංකාවෙන් නික්ම යැමෙන් පසු ඉදිරි දින කිහිපය ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය ලංකාව සම්බන්ධයෙන් වන සිය ස්ථාවරය ප්‍රකාශයට පත්කරනු ඇති බවද අපි එහිදී ලියා තැබුවෙමු.

අප වාර්තා කළ ආකාරයටම අයි.පී.එල්. තරගාවලියේ අවසන් තරගය පැවැති දින ඉන්දියාවේ අහමදාබාද් නුවරදී ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ නිලධාරීන් ජේ. ෂා මහතාගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පැවැත්වීමට පියවර ගත්තේය. මෙහිදී දැකගන්නට ලැබුණු විශේෂම සිදුවීම වූයේ අතුරු පාලන කමිටු ක්‍රියාත්මක වන බංග්ලාදේශයේ සහ ශ්‍රී ලංකාවේ ක්‍රිකට් සභාපතිවරුන්ට ඊට අරාධනා නොකිරීමට ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය කටයුතු කර තිබීමය. බොහෝ දෙනා පෙන්වා දෙන්නේ මෙය ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය මගින් ලංකාවට නිකුත් කළ බරපතළ සංඥාවක් යැයි කියාය. ඒ අනුව දැනටමත් බංග්ලාදේශය ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයට ප්‍රතිඥාවක් දී ඇත්තේ ලබන ජූලි 31 වැනිදාට පෙරාතුව සිය ක්‍රිකට් නිලවරණය පවත්වා අවසන් කරන බවටය. නමුත් තවමත් ලංකාව එවැනි පොරොන්දුවක් ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයට ලබාදී ඇති බවක් දැනගන්නට නැත.

කෙසේ වෙතත් දැනට මතුව ඇති තත්ත්වය යටතේ බොහෝ දෙනා පෙන්වා දෙන්නේ නියත වශයෙන් ලංකාවටද බංග්ලාදේශය කළාක් මෙන්ම මාස 3ක් ඇතුළත නිලවරණයකට යෑමට ඉරාන්ගේ අතුරු පාලන කමිටුවටද සිදුවනු ඇති බවකි.

එමෙන්ම අපට ඇති තවත් ආරංචියකින් කියැවෙන්නේ අයි.සී.සී.ය මගින් ක්‍රිකට් අතුරු කමිටුවේ කාලය මාස 3කට සීමා කරනු ලැබුවහොත් ඊට මුහුණදීම සඳහා ආණ්ඩුවද ඉතා රහසිගතව සූදානම් වන බවය. ඒ සඳහා පසුගිය දින කිහිපයේදී ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා වට ගණනාවක් පැවැත්වී ඇති බවක්ද 'රාජ්‍ය රහස්' තීරයට ආරංචිය. ඒ අනුව යම් හෙයකින් මාස 3ක් ඇතුළත නිලවරණය පවත්වන ලෙසට ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය දැනුම් දුනහොත් ඉරාන්ගේ සභාපතිත්වයෙන් යුත් කණ්ඩායමක් නිලවරණය සඳහා ඉදිරිපත් කිරීම සඳහා මේ දිනවල සාකච්ඡා පැවැත්වෙමින් තිබෙන බවක්ද දැනගන්නට ඇත.

## අධිකරණයෙන් සටනක්

**ආණ්ඩුව මේ දිනවල මුහුණ දෙන්නේ එක ප්‍රශ්නයක් ඉවර වනවිට තව ප්‍රශ්නයකට මුහුණ දෙන ආකාරයේ සිදුවීම්වලටය. මේ සියලු අර්බුද මැද්දේ පසුගිය සතියේදී ආණ්ඩුව මුහුණ දුන් අලුත්ම අර්බුදය වූයේ අගවිනිසුරු ඇතුළු ඉහළ අධිකරණ විනිසුරුවන්ගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කිරීමට ආණ්ඩුව ගෙන ඇති තීන්දුවය.**

මෙය පසුගිය සතියේ හදිසියේම අර්බුදයක් බවට පත්වන ලකුණු පහළ වූයේ ඉකුත් ජූනි 01 වැනිදා සවස ජනාධිපතිවරයා හා අධිකරණ නිලධාරීන්ගේ සංගමය හා මහාධිකරණ විනිසුරුවරුන්ගේ සංගමය හමුවූ අවස්ථාවේ සිදුවූ සිද්ධියක් මුල් කරගෙනය. මෙහිදී මෙම සාකච්ඡාව ආරම්භ කිරීමට පෙර ජනාධිපතිවරයා අධිකරණ නිලධාරීන්ට දැනුම් දී ඇත්තේ ස්ථිර වශයෙන්ම අගවිනිසුරු ඇතුළු ඉහළ අධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කිරීමට තමන් කටයුතු කරන බවය. ජනාධිපතිවරයා මෙම ප්‍රකාශය සිදුකරද්දී එම සාකච්ඡාවට අධිකරණ ඇමැති හර්ෂණ නානායක්කාර සහ අධිකරණ අමාත්‍යාංශ ලේකම් අයේෂා ජිනසේන පැමිණ නොසිටි බවත්, ජනාධිපතිවරයාගේ අදහස සම්බන්ධයෙන් අධිකරණ නිලධාරීන්ගේ සංගමය සහ මහාධිකරණ විනිසුරුවරුන්ගේ සංගමයේ නිලධාරීන් විශේෂ ප්‍රතිචාරයක් නොදැක්වූ බවත් ආරංචිය.

ජනාධිපතිවරයා මෙවැනි ආකාරයේ තීන්දුවක් ගැනීමට සූදානමින් සිටින බවට පළමු වරට රටට අනාවරණ කළේ වෙන කවුරුවත් නොව සජබයේ සිටින නීතිඥවරුන් වන සුජීව සේනසිංහත්, දයාසිරි ජයසේකරත්ය. එහිදී පාර්ලිමේන්තුවේ අදහස් දක්වමින් වරෙක සුජීව සහ දයාසිරි කියා සිටියේ ජනාධිපතිවරයා මේ හරහා අධිකරණයේ ස්වාධීනත්වයට බලපෑම් කිරීමට සූදානම් වන බවකි. එමෙන්ම විපක්ෂයේ කණ්ඩායම් රැස්වීම්වලදී පවා දයාසිරි කියා සිටියේ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ කාලය දීර්ඝ කිරීමට ජනාධිපතිවරයා ගනු ලබන උත්සාහයට විරුද්ධ විය යුතු බවත්, එය අධිකරණ ක්ෂේත්‍රයේ බරපතළ ගැටලු ඇතිවීමට හේතුවිය හැකි බවත්ය. නමුත් ඒ අවස්ථාවේදී විපක්ෂයේ කිසිවකුත් දයාසිරි කළ මේ කතාව ලොකුවට ඔළුවට ගත් ආකාරයක් දැකගන්නට ලැබුණේ නැත. නමුත් සියලු දෙනාම ඇවිස්සුණේ ජනාධිපතිවරයා අධිකරණ නිලධාරීන්ගේ රැස්වීම ආරම්භ වීමට ප්‍රථම එවැනි ප්‍රකාශයක් සිදුකර ඇති බවට මාධ්‍ය මගින් තොරතුරු වාර්තා කිරීමත් සමගය.

ඒ අනුව ජනාධිපතිවරයාගේ මෙම ප්‍රකාශයට මුලින්ම විරෝධය පළ කළේ වෙන කවුරුවත් නොව මෙරට නීති ක්ෂේත්‍රයේ ප්‍රබලම ආයතනය වන ශ්‍රී ලංකා නීතිඥ සංගමයය. එහිදී ඔවුන් විශේෂ නිවේදනයක් නිකුත් කරමින් ජනාධිපතිවරයාගේ මෙම ප්‍රකාශය දැඩිව හෙළාදැකීමට පියවර ගෙන තිබිණි.

එමෙන්ම ශ්‍රී ලංකා නීතිඥ සංගමය මෙම නිවේදනය නිකුත් කිරීමත් සමග ප්‍රධාන විපක්ෂය වන සමගි ජන බලවේගයද ජනාධිපතිවරයාගේ මෙම ක්‍රියාකලාපය දැඩිව විවේචනය කරමින් නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළේය. ඉන් අනතුරුව දැකගන්නට ලැබුණු විශේෂම සිදුවීම වූයේ මහාධිකරණයේ නීතිඥවරුන්ගේ සංගමයද දීර්ඝ ලිපියක් යොමුකරමින් මෙම උත්සාහයට එරෙහිව අදහස් දක්වා තිබීමය. ඒ අනුව දැකගන්නට ඇති විශේෂම සිදුවීම වන්නේ ජනාධිපතිවරයාගේ මෙම උත්සාහය හරහා දැනටමත් අධිකරණ ක්ෂේත්‍රයේ බරපතළ අවුලක් මතුවෙමින් පවතින බවකි.

සාමාන්‍යයෙන් විධායකය සහ අධිකරණය අතර ගැටුම් ඇතිවූ පළමු අවස්ථාව මෙය නොවේ. හිටපු ජනාධිපතිවරුන් වන ජේ.ආර්. ජයවර්ධන මහතාගේ සමයේදීද, රණසිංහ ප්‍රේමදාස මහතාගේ පාලන සමයේදීද, චන්ද්‍රිකා බණ්ඩාරනායකගේ සහ මහින්ද රාජපක්ෂගේ පාලන සමයන්හිදීද මේ ආකාරයටම විධායකය සහ අධිකරණය අතර බරපතළ ගැටුම් නිර්මාණය වී තිබිණි. නමුත් එහි අවසන් ප්‍රතිඵලය වී තිබුණේ ඒ ඒ ආණ්ඩු බලයෙන් විසිවීමටද එම ගැටුම් හේතුපාදක වී තිබීමය. ඒ අනුව අගවිනිසුරුගේ සහ ඉහළ අධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කිරීමට ජනාධිපතිවරයා තීරණය කර ඇත්තේ කුමන අරමුණකින්ද යන්න පැහැදිලි නැතත්, දැනට මතුවෙමින් පවතින තත්ත්වය යටතේ එය ඉතා ලේසියෙන් සිදුකළ නොහැකි ආකාරයේ ලකුණු පහළ වෙමින් පවතින බවක් දැකගන්නට පුළුවන.

එමෙන්ම මෙහි බරපතළකම මේ වනවිට විපක්ෂයටද වැටහී ගොස් ඇති නිසා පසුගිය සතියේ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාද හදිසි සාකච්ඡාවක් කැඳවා මෙම ප්‍රශ්නය පාර්ලිමේන්තුව ඇතුළේ දිගටම ඉදිරියට ගෙනයෑමේ සටන සුජීව සේනසිංහටත්, දයාසිරි ජයසේකරටත්, ෆයිසර් මුස්තාෆා මහතාටත් භාරදීමට පියවර ගත්තේය. ඒ අනුව අනෙකුත් පක්ෂ සමග සම්බන්ධීකරණ කටයුතු සිදුකොට ඒ සඳහා

අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු ආකාරය පිළිබඳව විපක්ෂ නායකවරයා මෙහිදී සුජීවටත්, දයාසිරිටත්, ෆයිසර්ටත් උපදෙස් ලබාදීමටත් පියවර ගෙන තිබිණ.

## රාජපක්ෂලාට අපලයි

**මෙවැනි පසුබිමක් යටතේ ආණ්ඩුව රාජපක්ෂවරුන් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග හිරු නොවී ඇති ආකාරයක්ද දැකගන්නට තිබේ. එහි පළමු ඉඟිය පසුගිය සතියේ දුක්ගැට ලාමුණේ පාන්දූ ප්‍රහාරය සම්බන්ධයෙන් මේ වනවිට අත්අඩංගුවට ගෙන සිටින හිටපු මුද්‍රිත අධ්‍යක්ෂ සුරේෂ් සලේ මහතාගේ ප්‍රකාශයක් මත හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට සහ තවත් හිටපු හමුදා නිලධාරීන් දෙදෙනකුට විදෙස් ගමන් තහනමක් පැනවීමට අධිකරණය කටයුතු කිරීමත් සමගය.**

ගෝඨාට මෙම විදෙස් ගමන් තහනම් පැනවීමත් සමග වඩාත්ම කලබලයට පත්වූයේ වෙන කවුරුවත් නොව රාජපක්ෂ පවුලේ ජ්‍යෙෂ්ඨයන්ය. ඒ අනුව පසුගිය සතියේ පැවැති රාජපක්ෂ පවුලේ ප්‍රබලයන්ගේ සාකච්ඡාවකදී මෙම විදෙස් ගමන් තහනම් පැනවීම බරපතළ සංඥාවක් ලෙස ගත යුතු බවත්, බොහෝ දුරට ඉදිරි දින කිහිපය ඇතුළත ගෝඨාව අත්අඩංගුවට ගැනීමේ සූදානමක් මැලූ බැල්මටම පෙනෙන්නට ඇති බවත් සාකච්ඡා වී ඇති බවත් ආරංචිය.

ගෝඨාට මෙම විදෙස් ගමන් තහනම පැනවූණේ රාජපක්ෂ පවුලේ තවත් ප්‍රබලයකු වන බැසිල් රාජපක්ෂ මහතාට එරෙහිව අධිකරණ දෙකකින්ම වරෙන්තු නිකුත් වී තිබූ පසුබිමකය. ඒ අනුව දැන් බැසිල් සිටින්නේ අත්අඩංගුවට ගන්නා ලෙසට අධිකරණය හරහා වරෙන්තු නිකුත්වය. නමුත් බැසිල් ඇමෙරිකාවේ ලොස් ඇන්ජලීස් නුවර වාසය කරන නිසා ආණ්ඩුව මේ වනවිට අප්‍රසිද්ධියේ බැසිල් අත්අඩංගුවට ගැනීම සඳහා අන්තර්ජාතික රතු නිවේදන නිකුත් කරවා ගැනීමට අවශ්‍ය සාකච්ඡා පවත්වමින් සිටින බවක් ආරංචිය. එය සාර්ථක වුවහොත් ජාත්‍යන්තර රතු නිවේදන හරහා බැසිල්ව ඇමෙරිකාවේදී අත්අඩංගුවට ගෙන මෙරටට ගෙන්වා ගැනීමට බලධාරීන් සූදානමින් සිටින බවක් දැනගන්නට ඇත.

## චමලුත් අත්අඩංගුවට?

**මීට අමතරව මේ දිනවල දේශපාලන ක්ෂේත්‍රයේ පැතිර යන තවත් කසුකුසුවකින් කියැවෙන්නේ රාජපක්ෂ පවුලේ ජ්‍යෙෂ්ඨයා වන චමල් රාජපක්ෂ මහතාවද අත්අඩංගුවට ගැනීමේ සූදානමක් පවතින බවකි. දැනටමත් චමල්ට එරෙහිව චෝදනා කිහිපයක්ම ඉදිරිපත්ව ඇති අතර, අවස්ථා කිහිපයකදීම අදාළ ආයතන මඟින් චමල්ව ප්‍රශ්න කිරීමටද ලක්කර ඇත.**

ඒ අනුව ඉදිරි දින කිහිපය තුළදී රාජපක්ෂ පවුලේ කිහිප දෙනකුම අත්අඩංගුවට පත්වීමේ අවදානමක් මතුව ඇති බව පසුගිය සතියේ පැවැති රාජපක්ෂවරුන්ගේ සාකච්ඡාවේදී දැඩිව අවධාරණයට ලක්ව තිබිණ. ඒ අනුව ඊට මුහුණ දෙන්නේ කෙසේද, ඒ සඳහා සහාය ලබාගත යුතු නීතිඥවරුන් කවුරුන්ද යන්න පිළිබඳවද රාජපක්ෂ පාර්ශ්වය එහිදී දීර්ඝ ලෙස සාකච්ඡා කොට ඇති බවක්ද ආරංචිය.

## කුට්ටිට කතන්ද දුන් කට්ට

**මේ ආකාරයට රාජපක්ෂවරුන්ට එරෙහිව ආණ්ඩුව පැත්තෙන් යම් යම් ක්‍රියාමාර්ග ගෙනෙද්දී සහ රාජපක්ෂවරුන් ආණ්ඩුවට එරෙහිව යුද ප්‍රකාශ කොට ඇති පසුබිමක පසුගිය සතියේ තවත් අපූරු සිදුවීමක් සිදුව ආකාරයක් දැකගන්නට ලැබිණි. ඒ, පොහොට්ටුවේ සිටින හිටපු මන්ත්‍රීවරයකු වූ තිස්ස කුට්ටිආරච්චි ආණ්ඩුවට එරෙහිව සටන් කරනවා වෙනුවට විපක්ෂයේ ප්‍රධාන පක්ෂය වූ සමගි ජන බලවේගයටත්, එහි නායකයා වූ සජිත් ප්‍රේමදාස මහතාට එරෙහිවත් සටනක් දියත් කර ඇති ආකාරයක් දැකගන්නට ලැබීමය.**

සාමාන්‍යයෙන් පොහොට්ටුව පසුගිය කාලසීමාවේදී සජබයට හෝ සජබ නායක සජිත්ට පහරදෙන තැනකට තල්ලු වී තිබුණේ නැත. සියලු දෙනාගෙ 'ම නොකිල එකඟතාව වී තිබුණේ විපක්ෂය එකමුතුව ආණ්ඩුවට එරෙහිව නැඟීසිටිය යුතු බවකි. නමුත් විපක්ෂය භේදභින්න කිරීම සඳහා කාගෙන් හෝ ලැබුණු කොන්ත්‍රාත්තුවකට අනුව තිස්සකුට්ටි පසුගිය සතියේදී සජබය සහ සජිත් ඉලක්ක කොටගෙන ඉතා පහත් [illegible]

## කුට්ටි පොහොට්ටුවෙන් දොට්ට

[illegible]

දැඩිව හෙළා දුටු බිහරියක් පාදුක්ක තිස්සකුට්ටිගේ ඉතිහාසයද හෙළිකර දක්වමින් ප්‍රතිප්‍රහාරයක් එල්ල කිරීමට පියවර ගත්තේය.

මීට අමතරව විශේෂඥ වෛද්‍ය චමල් සංජීව මාධ්‍ය හමුවක් පවත්වමින් තිස්සකුට්ටිගේ ප්‍රකාශය දැඩිව හෙළාදැකීමට පියවර ගත්තේය. අවසානයේදී මෙම ප්‍රහාරයේ රස්තය පොහොට්ටුවට දැනීමට වැඩි වේලාවක් ගතවූයේ නැත. ඒ අනුව වහාම නාමල් විශේෂ සාකච්ඡාවක් කැඳවා දැඩිව කියා සිටියේ පොහොට්ටුවේ සටන පවතින්නේ සජබය සමග නොව, ආණ්ඩුව සමග යැයි කියාය. ඒ අනුව වහාම සජබයට සහ සජිත්ට අනවශ්‍ය ලෙස ප්‍රහාර එල්ල කිරීමෙන් සියලු දෙනාම වැළකී සිටිය යුතු බව නාමල් එහිදී තිස්සකුට්ටි ඉලක්ක කරගනිමින් දැඩි අනතුරු ඇඟවීමක් කිරීමට පියවර ගත්තේය. නාමල්ට එසේ සිදුකිරීමට සිදුවූයේ පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන් විශාල පිරිසක් දිගින් දිගටම නාමල්ට කතාකරමින් තිස්සකුට්ටි මේ කරන ප්‍රකාශ හරහා පොහොට්ටුව ජනතාව අතර අප්‍රසාදයට පත්වන බවටත්, විපක්ෂය ඇතුළේ අනවශ්‍ය ප්‍රශ්නයක් ඇතිකිරීමක් කුට්ටි කටයුතු කරන බවටත්, කාගේ හෝ කොන්ත්‍රාත්තුවක් තිස්සකුට්ටි විසින් සිදුකරන බවටත් දැනුම්දීමත් සමගය. ඒ අනුව මෙම ජ්‍යෙෂ්ඨයන් නාමල්ට දැඩිව කියා සිටියේ තිස්සකුට්ටි නිසා පක්ෂයට විශාල හානියක් සිදුවන බවත්, වහාම ඔහු සම්බන්ධයෙන් දැඩි ක්‍රියාමාර්ගයක් ගත යුතු බවත්ය. ඒ අනුව මේ වනවිට තිස්සකුට්ටිව පොහොට්ටුවෙන් පන්නා දැමීමට පක්ෂ ජ්‍යෙෂ්ඨයන් තීරණය කොට ඇති බවක්ද ආරංචිය.



# සජිත් වගකීම් බාරදෙයි

> ඉන් පළමු වැන්න වූයේ ජනාධිපතිවරයා විසින් අගවිනිසුරු සහ උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යාමේ වයස දීර්ඝ කිරීමට එරෙහි මෙහෙයුම සුජීවට සහ දයාසිරිට භාරදීමය.

කපිල පුංචිහේවාගෙන්

## රාජ්‍ය රහස්

## රනිල් කරන එකම දේ

**සිංගප්පූරුවේ සිදුකළ සැත්කමෙන් අනතුරුව ලංකාවට පැමිණි එජාප නායක රනිල් වික්‍රමසිංහ මේ දිනවල සිටින්නේ සිය 5 වැනි පටුමඟේ නිවසට වී විවේක සුවයෙනි. ඒ අතරවාරයේ විවිධ දේශපාලනඥයන් නිවසට ගෙන්වා ගනිමින් ඔවුන් සමග සාකච්ඡා කරමින් විවිධ දේශපාලන ජෝශ් ගැසීමට රනිල් කටයුතු කරමින් සිටින බවක් දැනගන්නට පුළුවන.**

අප පසුගිය සතියේ අනාවරණය කළ පරිදි හිටපු අමාත්‍ය විමල් වීරවංශ 5 වැනි පටුමඟේ සිය නිවසට කැඳවා රනිල් ගැසුවේද එවැනිම දේශපාලන ජෝශ් එකකි. මීට අමතරව රනිල් කරන්නේ සමාජ මාධ්‍ය හසුරුවන පිරිස් ගෙන්වා සජබයටත්, සජිත්ටත් විවිධාකාරයේ ප්‍රහාර එල්ල කරමින් සජබය ඇතුළේ අර්බුද නිර්මාණය කිරීමය. සාමාන්‍යයෙන් මෙවැනි අවස්ථාවකදී රනිල් වසර 32ක් පුරා තමන් යටතේ දියාරු වී ගිය එජාපය යළි කෙළින් කවින් සිටුවීමට උත්සාහ ගතයුතුව තිබුණද, එවැන්නකට වචනයකින් හෝ දායකත්වය නොදී, මේ වනවිට රනිල් කරමින් සිටින්නේ සජබය විනාශ කිරීමට සිය සම්පූර්ණ කාලයම යොදා තිබීමය. රනිල් මේ ජෝස්බුක් මෙහෙයුම් භාරදී තිබෙන්නේ වෙන කාටවත් නොව සිය දොස්ත් දෙදෙනකුටය. මේ දොස්ත් දෙදෙනාගේ නම් 'රාජ්‍ය රහස්' තීරය සතුව තිබුණද මේ අවස්ථාවේදී අප එය හෙළිකිරීමට කටයුතු කරන්නේ නැත.

කෙසේ වෙතත් රනිල් කරන්නේ මේ දොස්ත් දෙදෙනා සමග සෑම සඳුදා දිනකදීම ෆේස්බුක් මෙහෙයුම් කණ්ඩායම මුණගැසීමය. මේ සාකච්ඡාවේදී රනිල් කරන්නේ එම සතිය පුරා සජිත්ට සහ සජබයට ප්‍රහාර එල්ල කළ යුතු ආකාරය පිළිබඳ ෆේස්බුක් කණ්ඩායමට උපදෙස් ලබා දීමය. ඒ අනුව විවිධ මාතෘකා තමන්ට හිතූ හිතූ අයුරින් එහෙට මෙහෙට පෙරළමින් මෙම සාකච්ඡාවේදී රනිල් විසින් සිය ෆේස්බුක් කණ්ඩායම වෙත විස්තර කරනු ලබයි. ' සජබය ඇතුළේ අර්බුද', 'සජිත් - හර්ෂ අතර ගැටුමක්..', 'චම්පික පොදු අපේක්ෂකයා', 'එජාප නායකත්වය හර්ෂට' යනාදී වශයෙන් සතිය පුරා විවිධ අසත්‍ය ප්‍රවෘත්ති ෆේස්බුක් කණ්ඩායම් හරහා සමාජගත වන්නේ රනිල් ලබාදෙන එම උපදෙස්වලට අනුවය.

## සුජීව රනිල් හමුවක්

**එමෙන්ම සජබයේ පුවදුන් විමසීමට නිවසට එන විවිධ මන්ත්‍රීවරුන්ද සිය ෆේස්බුක් මෙහෙයුම් සඳහා උපයෝගී කරගැනීමටද රනිල් මේ වනවිට කටයුතු කරමින් සිටී. එහිදී ෆේස්බුක් කණ්ඩායමට ලැබී ඇති උපදෙස වී ඇත්තේ එසේ රනිල්ව බැලීමට එන සජබයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන් රනිල්ට සහාය ලබාදීම සඳහා පැමිණෙන බවට රටට පෙන්වන ලෙසටය.**

ඊට හොඳම උදාහරණය වන්නේ සුජීව සේනසිංහ රනිල්ගේ පුවදුන් විමසීමට ගිය අවස්ථාවය. පසුගිය සතියේ සුජීව සජිත්ව මුණගැසී, තමන් රනිල්ගේ පුවදුන් බැලීමට යන බව දැනුම් දීමට කටයුතු කොට තිබිණි. සජිත්ද ගත් කටටම කිසිදු පැකිලීමකින් තොරව කියා සිටියේ එහි කිසිදු ගැටලුවක් නොමැති බවත්, රනිල්ගේ පුවදුන් බැලීමට එහි යන ලෙසත්ය.

ඒ අනුව, අප ඉතා විශ්වසනීයව දැනගත් තොරතුරුවලට අනුව කියා සිටින්නේ සුජීව සහ රනිල් අතර පැවැති සාකච්ඡාව විනාඩි 5කට පමණක් සීමා වූ බවය. එහිදී ගිය විගසම සුජීව රනිල්ගේ පුවදුන් විමසීමෙන් අනතුරුව රනිල් ඊට පිළිතුරු දෙමින් කියා සිටියේ දැන් තමන් යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් පසුවන බවය. ඒ අනුව විනාඩි දෙක තුනක් ආගිය තොරතුරු කතාකරමින් සිට සුජීව යන්නට සූදානම් වනවිට රනිල් සුජීවගෙන් විමසා සිටියේ 'දැන් කොහොමද පක්ෂ දෙක එකතු වෙන වැඩේ...?' යැයි කියාය. ඊට සිනාසෙමින් සුජීව කියා සිටියේ 'අයියෝ සර්.... සර්ම ඔය සජිත්ට කතා කරලා අහලා ඉවරයක් කරන්නකෝ...' යනුවෙනි. ඒ අනුව 5 වැනි පටුමඟේ නිවසින් පිටවූ සුජීව කෙළින්ම ගියේ සජිත්ව හමුවීමටය. එහිදී රනිල් සමග ඒ කෙටි විනාඩි 5 ඇතුළත කතාබහ කළ සියලු දේ සුජීව සජිත්ට දැනුම් දී සිටියේය. නමුත් මොහොතක් යෑමට මත්තෙන් සමාජ මාධ්‍ය තුළ රනිල්ගේ සමාජ මාධ්‍ය කණ්ඩායමෙන් අපූරු පෝස්ට් රැසක් නිකුත් කොට තිබිණි. ඒවායින් කියැවුණේ සුජීව රනිල් හමුවීමට පැමිණ ඔහුට සහාය පළකිරීමට කටයුතු කළා වැනි කතාවකි.

## සජිත් වැඩ බාර දෙයි

**මේ ආකාරයට ආණ්ඩුව සහ රනිල්ගේ පැත්තෙන් විවිධ දේශපාලන මෙහෙයුම් දියත් කරද්දී දියත් කරද්දී විපක්ෂ නායක සජිත්ද පසුගිය සතියේ සිය මන්ත්‍රී කණ්ඩායමේ කිහිප දෙනකු කැඳවා මෙහෙයුම් කිහිපයක්ම ඔවුන්ට භාරදීමට පියවර ගත්තේය.**

ඉන් පළමු වැන්න වූයේ ජනාධිපතිවරයා විසින් අගවිනිසුරු සහ උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කිරීමට එරෙහි මෙහෙයුම සුජීවට සහ දයාසිරිට භාරදීමය. ඉන් අනතුරුව සජිත් ආණ්ඩුව ඇතුළේ සිදුවන අක්‍රමිකතා රටට හෙළිදරව් කිරීම සඳහා වෙනම කමිටුවක් ආරම්භ කළ අතර, එහි ප්‍රධානත්වය මුජිබර් රහුමාන්ට ලබාදීමට කටයුතු කළේය. එමෙන්ම මෑත කාලයේ ආණ්ඩුව විශාල දෙදරීමකට ලක්කළ බල ගල්අඟුරු ගෙන්වීමේ සිද්ධිය සම්බන්ධයෙන් තවදුරටත් සොයා බලා පාර්ලිමේන්තුව සහ රට දැනුවත් කිරීමේ වගකීම මරික්කාර්ට පැවරීමටද සජිත් පියවර ගත්තේය. ඊට හේතු වී තිබුණේ විදුලිබල ක්ෂේත්‍රයේ විශේෂඥයන් විසින් ඉදිරියේදී බරපතළ බලශක්ති අර්බුදයක් රට තුළ ඔතුවීමේ අවදානමක් ඇති බවට සජිත්ට තොරතුරු වාර්තා කර තිබීම නිසාය. මීට අමතරව සජිත් පසුගිය සතියේ සිවිල් සංවිධාන නියෝජිතයන් කැඳවා ඔවුන් සමගද ආණ්ඩුවට එරෙහිව විශාල මෙහෙයුමක් දියත් කිරීම පිළිබඳ සාකච්ඡා කිරීමට පියවර ගත්තේය.

## ආණ්ඩුව නැමෙයි

**ඒ අතරවාරයේ පසුගිය සතියේ පාර්ලිමේන්තුවේ පැවැති පක්ෂ නායක රැස්වීමේද අපූරු සිදුවීමක් සිදුවිය. සාමාන්‍යයෙන් පසුගිය කාලය පුරාම පැවැති පක්ෂ නායක රැස්වීම්වලදී ආණ්ඩුව සිය ආධිපත්‍යය එහි පතුරුවාගෙන අභිමත ආකාරයෙන් සිටීමට කටයුතු කළත්, පසුගිය සතියේ පැවැති පක්ෂ නායක රැස්වීමේදී ඊට හාත්පසින්ම වෙනස් සිදුවීමක් එහි සිදුවී දෙනාටම දැකගන්නට ලැබීම ඊට හේතුව විය.**

එදින පක්ෂ නායක රැස්වීමට ආණ්ඩුව නියෝජනය කරමින් බිමල් රත්නායක, වසන්ත සමරසිංහ ඇතුළු ජ්‍යෙෂ්ඨ ඇමැතිවරුන් කිහිප දෙනකු සහභාගී වී සිටි අතර, විපක්ෂය නියෝජනය කරමින් සජිත් ඇතුළු පක්ෂ නායකයන් රැසක් එක්ව සිටියහ. මෙහිදී සජිත් මුලින්ම ආණ්ඩුව ඉදිරියේදී ගෙන ඒමට සූදානමින් සිටින පරිසර පනතකට පාරිසරික සංවිධානවලින් දැඩි විරෝධයක් එල්ලවී ඇති බව පෙන්වා දී එම ගැටලුව විසඳන තෙක් පරිසර පනත ගෙන ඒම කල් දමන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටියේය. සාමාන්‍යයෙන් වෙනදා නම් සජිත්ගෙන් හෝ විපක්ෂයෙන් මෙවැනි ඉල්ලීමක් ලද වහා ආණ්ඩුව ඊට එරෙහිව ප්‍රතිචාර දක්වුවද එදින කිසිදු ගැටුමකින් තොරව සජිත් ඉල්ලූ ආකාරයටම එම පරිසර පනත් කෙටුම්පතේ ගැටලු සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගන්නා තෙක් එය කල් දැමීමට ආණ්ඩුව කටයුතු කළේය.

මීට අමතරව මතුවෙමින් පවතින ආර්ථික අර්බුදය සම්බන්ධයෙන් දිනක විවාදයක් ඉල්ලා සිටීමට විපක්ෂය යෝජනා කරද්දී යම් අදහස් නුවමාරුවකින් පසු ඊටද එකඟතාව පළකිරීමට ආණ්ඩුව කටයුතු කිරීම විශේෂත්වයක් විය. ඒ අනුව වෙනදා නම් විපක්ෂය සමග කැත්තට පොල්ල ලෙස සිටි ආණ්ඩුව මේ වනවිට විපක්ෂය සමග නම්‍යශීලී සහ සුහදශීලී ආකාරයෙන් කටයුතු කිරීමට තීරණය කර ඇති ආකාරයක් දැකගත හැකි විය.

> එජාපය නියෝජනය කරන පළාත් සභා මන්ත්‍රීවරුන් පවා එක්ව සිටීමය. ඒ බව දුටු සජිත් පවා පුදුමයට පත්ව ඔවුන් සමග කතාබහ කරන විට ඔවුන් සජිත්ට කියා සිටියේ එජාපය එකතු වුවත් නැතත් ඉදිරි පළාත් සහා මැතිවරණයේදී සජබය සමග එක්ව තරග වැදීමට තමන් සූදානම් යැයි කියාය.

එමෙන්ම පසුගිය සතියේ දී විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා තවත් විශේෂ හමුවක් විපක්ෂ නායක කාර්යාලයේදී පැවැත්විය. ඒ සඳහා ලංකාවම නියෝජනය වන පරිදි හිටපු පළාත් සභා මන්ත්‍රීවරුන් කැඳවීමට පියවර ගැනීමය. එහි ඇති විශේෂත්වය වූයේ එම රැස්වීමට මේ වනවිට සජබය නියෝජනය කරන හිටපු පළාත් සභා මන්ත්‍රීවරුන් පමණක් නොව, එජාපය නියෝජනය කරන පළාත් සභා මන්ත්‍රීවරුන් පවා එක්ව සිටීමය. ඒ බව දුටු සජිත් පවා පුදුමයට පත්ව ඔවුන් සමග කතාබස් කරන විට ඔවුන් සජිත්ට කියා සිටියේ එජාපය එකතු වුවත් නැතත් ඉදිරි පළාත් සභා මැතිවරණයේදී සජබය සමග එක්ව තරග වැදීමට තමන් සූදානම් යැයි කියාය. ඒ අනුව මේ වනවිට සජිත් තීරණය කොට ඇත්තේ විපක්ෂයේ අනෙකුත් සියලු පක්ෂ ඒකාබද්ධ කොටගෙන පළාත් සභා මැතිවරණය ඉල්ලා අලුත් සටනක් ආරම්භ කිරීමටය.

## අලුත් අගරදගුරු පියතුමෙක් එනවා

**කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන් අවසන් වතාවට වතිකානුවට ගොස් පුළු මොහොතකට මුතුන් පාප්වහන්සේ මුණගැසී සාකච්ඡා කළ ආකාරයත්, එහිදී කාදිනල් හිමියන් තමන්ට සේවා විශ්‍රාම ලබාදෙන ලෙස ඉල්ලා සිටි ආකාරයත්, අවුරුදු 75 ඉක්මවීමෙන් පසු අගරදගුරු පදවියෙන් විශ්‍රාම යෑමේ සම්ප්‍රදාය පිළිබඳ දැනුම් දෙමින් පාප්වහන්සේ එය ප්‍රතික්ෂේප කළ ආකාරයත් මීට මාස ගණනාවකට ඉහතදී 'රාජ්‍ය රහස්' තීරය මඟින් විශේෂ අනාවරණයක් කරමින් අපි වාර්තා කළෙමු.**

එමෙන්ම එම හමුවේදී නව අගරදගුරුවරයා වශයෙන් පත්විය යුතු තැනැත්තා පිළිබඳ නම් තුනක් නම්කර එවන ලෙසද මැල්කම් රංජිත් හිමිපාණන්ට පාප්වහන්සේ විසින් දැනුම් දීමක් කර තිබිණි. අප ඒ බවද එකල රාජ්‍ය රහස් තීරයෙන් වාර්තා කිරීමට කටයුතු කළෙමු.

ඒ අනුව ලබන 26, 27 යන දෙදින ලොව පුරා සිටින කාදිනල් හිමිපාණන් වහන්සේලා වතිකානුවට කැඳවීමට ලියෝ පාප්වහන්සේ කටයුතු කොට තිබේ. ඒ අනුව ඊට කාදිනල් හිමිවරුන් 237ක් සහභාගී වීමට නියමිතව ඇති අතර, විශේෂ මාතෘකා කිහිපයක්ම එම හමුවේදී සාකච්ඡා වීමට නියමිතව ඇති බවක් දැනගන්නට ඇත.

එමෙන්ම අපට ඇති තොරතුරුවලින් කියැවෙන්නේ මැල්කම් රංජිත් කාදිනල් හිමියන්ද මෙවර වතිකානුවේ රැස්වීමට සහභාගී වීමට සූදානමින් සිටින බවත්, එහිදී ඊළඟ අගරදගුරු තනතුර සඳහා අලුත් නම් 3ක් පාප්වහන්සේ වෙත ඉදිරිපත් කිරීමට සැලසුම් කොට ඇති බවත්ය. ඒ අනුව නිල නොවන තොරතුරුවලින් කියැවෙන්නේ කොළඹ සහායක අගරදගුරු වන ජේසෙප් ඇන්තනී, කොළඹ සහායක අගරදගුරු වන ඇන්ටන් රංජිත් සහ ගාල්ල බිෂොප්වරයා ලෙස කටයුතු කරන රේමන්ඩ් වික්‍රමසිංහ යන පියතුමන්ලාගේ නම් එසේ කාදිනල් හිමියන් විසින් නව පාප්වහන්සේ වෙත භාරදීමට නියමිතව ඇති බවය. එමෙන්ම අපට දැනගන්නට ඇති තොරතුරුවලින් කියැවෙන්නේ මෙම හමුව සඳහා පාප්වහන්සේ කාදිනල් හිමියන්ට විනාඩි 3ක කාලයක් පමණක් ලබාදී ඇති බවය. ලබන නොවැම්බර් 15 වැනිදා අගරදගුරු මැල්කම් රංජිත් හිමිපාණන්ගේ පදවියේ ධූර කාලය අවසන් වීමට නියමිතව ඇති බැවින් ඊට මාස 2කට පෙරාතුව නව අගරදගුරුවරයා සම්බන්ධයෙන් වූ ඉඟිය පාප්වහන්සේ විසින් ලබාදීමට නියමිතය. ඒ අනුව 2027 වසර ආරම්භ වනු ඇත්තේ වසර ගණනාවකට පසු ලංකාවට අලුත් අගරදගුරුවරයකු පත්කරමිනි.

කෙසේ වෙතත් මෙම වතිකානු සංචාරයෙන් පසුව මැල්කම් රංජිත් හිමිපාණන් යළි ලංකාවට පැමිණෙන්නේ සුපුරුදු පරිදි යුරෝපා සංචාරයක නිරත වීමෙන් අනතුරුවය.

**කපිල පුංචිමාත්තගේ**



'ඔපරේෂන් ක්ලීනප්' 'මතට තිත' 'යුක්තිය' 'රටම එකට'

# කුඩු කුඩුද? නඩු විතරද?



පොලිස්පති ලක් කොඩිතුවක්කුගේ සිට ප්‍රියන්ත වීරසූරිය දක්වා...